සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

13 ශ්‍රේණිය අවසාන වාර පරීක්ෂණය - 2024
தரம் 13 ஆண்டிறுதிப் பரீட்சை - 2024 / Grade 13 Final Term Test - 2024

2126

ව්‍යාපාර අධ්‍යයනය - II

32 S II

කාලය / நேரம் / Time } පැය 3 මි. 10

නම / பெயர் / Name } ....

විභාග අංකය / சுட்டிலக்கம் / Index No. } ....

පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05 ට පිළිතුරු සපයන්න.

01. "සී/ස සොබා (පෞද්ගලික) සමාගම රූපලාවණ්‍ය නිෂ්පාදන කටයුතු සිදු කරන සමාගමකි." සහෝදරියන් වන පියුමි හා රුවනි දේශීය අමුද්‍රව්‍ය, ආනයනික ඇසුරුම් යොදා නිෂ්පාදන කටයුතු සිදු කරයි. තරඟය කොතරම් ඉහළ වුවද, මෙම නිෂ්පාදිතවලට ඉහළ ඉල්ලුමක් පවතී. ජාත්‍යන්තර ප්‍රදර්ශනයකට සහභාගී වූ පියුමි හා රුවනිට විදේශීය ඇණවුම් කිහිපයක් ද ලැබී ඇත. ඉහළ ගුණත්වයෙන් යුතු අමුද්‍රව්‍ය සපයා ගැනීමත් නිෂ්පාදිතවල ගුණත්වය තවත් ඉහල නැංවීමටත් මොවුන්ට අවශ්‍යව ඇත්තේ අපනයන ඉලක්ක නිසාවෙනි.

I. (අ) පියුමි හා රුවනිගේ ව්‍යාපාරයේ මූලික ව්‍යාපාර කටයුතු සඳහන් කරන්න. (ලකුණු 02යි)
(ආ) මෙම ව්‍යාපාරයේ යෙදවුම් හතරක් උදාහරණ සහිතව සඳහන් කරන්න. (ලකුණු 02යි)

II. (අ) මෙම සිද්ධියට අදාළ වාණිජ්‍ය හා කර්මාන්ත ක්ෂේත්‍රයට අදාළ කාර්යය වෙන්කර දක්වන්න. (ලකුණු 02යි)
(ආ) 1. සී/ස සොබා (පෞද්ගලික) සමාගමේ ආසන්න හා සාර්ව පරිසර සාධක දෙක බැගින් සඳහන් කරන්න (ලකුණු 01යි)
2. ඔබ සඳහන් කල සාර්ව පරිසර සාධකයන් ආසන්න පරිසර සාධකයට කරන බලපෑම පැහැදිලි කරන්න (ලකුණු 01යි)

III. (අ) මෙම ව්‍යාපාරයෙන් ආර්ථිකයට අත්වන ප්‍රතිලාභ හතරක් සඳහන් කරන්න. (ලකුණු 02යි)
(ආ) සී/ස සොබා (පෞද්ගලික) සමාගමට, රජයෙන් ලැබෙන සහාය හා මගපෙන්වීම වැදගත් වන ආකාරය සඳහන් කරන්න. (ලකුණු 02යි)

IV. (අ) සී/ස සොබා (පෞද්ගලික) සමාගමට බලපාන නෛතික අණපනත් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02යි)
(ආ) පියුමි හා රුවනිගේ ව්‍යාපාරය ගනුදෙනුකරුවන්ට හා සමාජයට ඉටු කළ යුතු සමාජ වගකීම් දෙක බැගින් නම් කරන්න. (ලකුණු 02යි)

V. (අ) ආනයනික අමුද්‍රව්‍ය සඳහා රජය පනවා ඇති බදු පහත හෙලූ විට ඉන් බලපෑම් වන පාර්ශ්ව හතරක් සඳහන් කර, ඉන්වන බලපෑම බැගින් සඳහන් කරන්න. (ලකුණු 02යි)
(ආ) "බැංකු පොලී අනුපාතිකය පහත හෙළීමට මහ බැංකුව අපේක්ෂා කරන බව සන්නිවේදන මාධ්‍යවලින් අසන්නට ලැබේ." මෙලෙස බැංකු පොලී අනුපාතිකය පහත හෙලූ විට ව්‍යාපාරවලට වන බලපෑම පැහැදිලිකරන්න. (ලකුණු 02යි)

02. "ප්‍රධාන මාර්ග දෙපස හා නිතර මිනිසුන් ගැවසෙන ස්ථානවල ක්ෂණික ආහාර සකසා අලෙවි කිරීම කලාවකි. ඉතා ක්ෂණිකව පිළියෙල කිරීමත්, පිළිගැන්වීමේත්, පොලිතින් ඇසුරුම් මෙන්ම හරිත ඇසුරුම් ද ව්‍යාපාරිකයින් භාවිතා කිරීම මෙහි විශේෂත්වයකි"

I. (අ) වර්තමානයේ දී වෙළෙඳපොළ මෙතරම් සංකීර්ණ වීමට හේතු හතරක් සඳහන් කරන්න. (ලකුණු 02යි)
(ආ) වෙළෙඳුන් විසින් සිදුකරනු ලබන විෂමාචාර හතරක් සඳහන් කරන්න. (ලකුණු 02යි)

II. ''පාරිභෝගිකයා වගකීමෙන් කටයුතු කළ විට පාරිභෝගික අයිතිවාසිකම් දිනාගත හැක.''
(අ) ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය ප්‍රමිති ක්‍රියාත්මක කරන ආකාර හතරක් සඳහන් කරන්න. (ලකුණු 02යි)
(ආ) පාරිභෝගික අයිතිවාසිකම් රැකීමට ඇති ආයතනයක් ලෙස ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය ව්‍යාපාර වලට වැදගත් වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 02යි)

III. (අ) මෙවැනි ව්‍යාපාර පවත්වාගෙන යාමට වෙළෙඳුන් බහුලව භාවිතා කරන ව්‍යාපාර සංවිධාන ක්‍රම සඳහන් කරන්න. (ලකුණු 02යි)

(ආ) මෙවැනි ව්‍යාපාර සංවිධානවල සමාන අසමානකම් දෙක බැගින් සඳහන් කරන්න. (ලකුණු 02යි)

IV. "ව්‍යාපාර සංයෝජනය වීම තුළින් කළමනාකරණය කාර්යක්ෂමව කරගැනීමට බොහෝ ව්‍යාපාර උත්සාහ කරයි"

(අ) ව්‍යාපාර සංයෝජනය වීම යන්න හඳුන්වන්න. (ලකුණු 02යි)

(ආ) තිරස් හා සිරස් සංයෝජනය උදාහරණයක් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 02යි)

V. ''රජ්‍ය ව්‍යවසායන් ආර්ථිකය තුළ කාර්යක්ෂමව ක්‍රියාත්මක වීම අත්‍යවශ්‍ය වේ."

(අ) රාජ්‍ය අංශයේ ව්‍යාපාර සංවිධාන හතරක් සඳහන් කරන්න. (ලකුණු 02යි)

(ආ) ක්‍රියාකාරීත්වය තුළ රාජ්‍ය සමාගම් කාර්යක්ෂම වීමට හේතු පැහැදිලි කරන්න. (ලකුණු 02යි)

03. "පොල් කටු හා කිතුල් ලී පතුරු ආශ්‍රයෙන් විවිධ නිමයුම් වල යෙදෙන පියුමාල් නිවෙස් වල ට මෙන්ම මහා පරිමාණ හෝටල් ව්‍යාපාර වලට අවශ්‍ය විවිධ නිමවුම් සිල්ලර හා තොග ලෙස ලබා දෙන තමන්ගේම ව්‍යාපාරයක් පවත්වාගෙන යයි. තම හැකියාව වඩාත් දියුණු කරගනිමින්, වගකීම සීමා සහිත වූ ව්‍යාපාරයක් ලෙස නව යන්ත්‍ර ලබාගෙන ව්‍යාපාරය පුළුල් කරගැනීමටද ඔහු බලාපොරොත්තු වෙයි."

I. (අ) පියුමාල් සතු ව්‍යවසායකත්ව නිපුණතා හතරක් සඳහන් කරන්න. (ලකුණු 02යි)

(ආ) පියුමාල්ගේ ව්‍යාපාරයට ඇණවුම් සපුරාලීමේදී මුහුණදීමට සිදුවන ගැටලු හතරක් සඳහන් කරන්න. (ලකුණු 02යි)

II. (අ) පියුමාල් වැනි ව්‍යවසායකයින්ට ලබාදිය හැකි දිරිගැන්වීම් දෙක බැගින් වර්ග කර දක්වන්න. (ලකුණු 02යි)

(ආ) පියුමාල්ට ව්‍යවසායකත්වයෙන් ලැබිය හැකි ප්‍රතිලාභ හතරක් සඳහන් කරන්න. (ලකුණු 02යි)

III. ව්‍යවසායකත්වය තුළින් ආර්ථික සංවර්ධනයට අත්වන දායකත්වයන් පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

IV. ''ශ්‍රී ලංකා මහබැංකුව හා බලපත්‍රලාභී වාණිජ බැංකු ආර්ථිකය තුළ වෙන් වෙන් වූ කාර්යයන් සිදුකරයි.''

(අ) ශ්‍රී ලංකා මහ බැංකුව හා බලපත්‍රලාභී වාණිජ බැංකු අතර වෙනස්කම් දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 02යි)

(ආ) ජංගම ගිණුම් හිමි ව්‍යාපාරිකයකුට එවැනි ගිණුමක් පවත්වාගෙන යාමෙන් ලැබෙන ප්‍රයෝජන සඳහන් කරන්න. (ලකුණු 02යි)

V. "විශේෂිත මූල්‍ය ආයතන තුළ ව්‍යවසායකත්ව ප්‍රාග්ධන සමාගම් මෙන්ම කොටස් තැරැව්කාර සමාගම් වැදගත් කාර්යභාරයක් ඉටු කරයි"

(අ) ව්‍යවසායකත්ව ප්‍රාග්ධන සමාගම් යන්න එහි කාර්යය දක්වමින් හඳුන්වන්න. (ලකුණු 02යි)

(ආ) කොටස් තැරැව්කාර සමාගම්වල කාර්යය හතරක් සඳහන් කරන්න. (ලකුණු 02යි)

04. " සන්නිවේදනය ව්‍යාපාරික කටයුතු සඳහා මෙන්ම සමාජීය කටයුතු සඳහාද වැදගත් වේ."

I. (අ) ව්‍යාපාර කටයුතු සඳහා සන්නිවේදනයෙහි ඇති වැදගත්කම සඳහන් කරන්න. (ලකුණු 02යි)

(ආ) සන්නිවේදන මාධ්‍යයක් ලෙස ලිඛිත සන්නිවේදන මාධ්‍යයේ ඇති වාසි අවාසි දෙක බැගින් සඳහන් කරන්න. (ලකුණු 02යි)

II. ''ගබඩා කරණය ව්‍යාපාරයකට අත්‍යවශ්‍ය සහාය සේවාවකි"

(අ) ගබඩාවක් ස්ථානගත කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණු හතරක් සඳහන් කරන්න. (ලකුණු 02යි)

(ආ) ගබඩාවට සම්බන්ධ පිරිවැය වර්ග කර දක්වන්න. (ලකුණු 02යි)

III. ''වෙළෙඳාම පහසුවීමට අතරමැදියන් යොදා ගැනීම අවශ්‍ය වෙයි."

(අ) වෙළඳාමේදී අතරමැදියන් යොදා ගැනීමේ වාසි හා අවාසි දෙක බැගින් සඳහන් කරන්න. (ලකුණු 02යි)

(ආ) වෙළෙඳාමට තොග වෙළෙන්දන්ගෙන් ඉටුවන සේවා හතරක් සඳහන් කරන්න. (ලකුණු 02යි)

IV. විදේශ වෙළෙඳාම් ප්‍රවණතා හතරක් සඳහන් කරන්න. (ලකුණු 04යි)

V. ''විද්‍යුත් වෙළඳාමෙන් විවිධ පාර්ශ්වයන්ට ප්‍රතිලාභ අත්වන අතරම විවිධ ගැටලු පවතී."

(අ) විද්‍යුත් වෙළඳාමින් ව්‍යාපාරයකට ලැබෙන වාසි දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02යි)

(ආ) විද්‍යුත් වාණිජ්‍යයේ සීමා හතරක් සඳහන් කරන්න. (ලකුණු 02යි)

05."සීමා සහිත ඇපෙඬ සමාගම'' සිය පනස් වන සංවත්සරය සැමරීමේ උත්සවයේදී එහි ප්‍රධාන විධායක විසින් ප්‍රකාශ කරන ලද ප්‍රකාශයෙන් කොටසක් පහත දැක්වේ.

"අද අප මේ කර්මාන්තය තුළ ප්‍රමුඛයින් බවට පත්වී ඇත. එහෙයින් අපනයන ආදායමින් 25%කට වැඩි ආදායමකට දායක වීමට අපට හැකියාව ලැබී ඇත. එමෙන්ම දේශීය කර්මාන්තය තුළ ප්‍රමුඛයින් බවට පත්වී ඇත.

මෙවැනි තත්ත්වයක් ළඟා කර ගැනීමට හැකියාව ලැබී තිබෙනුයේ ආයතනය තුළ කටයුතු කරන කළමනාකරුවන්, සේවකයින් අවබෝධ කර ගැනීමටත් ඔවුන් සමඟ සහයෝගයෙන් වැඩ කිරීමටත් අග්‍ර කළමනාකරුවන් තුළ පවතින හැකියාවත් සේවකයින් තුළ පවතින උනන්දුවත් හා කැපවීම ත් නිසාය. "

I. (අ) ඉහත සිද්ධියේ සඳහන් ආකාරයට කළමනාකරුවන්, සේවකයින් අවබෝධ කරගෙන ඔවුන් සමඟ සහයෝගයෙන් වැඩ කිරීම හැඳින්විය හැක්කේ කවර නමකින් දැයි දක්වා එම කුසලතාව තුළ අන්තර්ගත හැකියාවක් තුනක් නම් කරන්න. (ලකුණු 02යි)

(ආ) ඔබ ඉහත සඳහන් කළ කුසලතාව කළමනාකරුවන්ට වැදගත් වන්නේ කෙසේදැයි දක්වා ඊට හේතු මොනවාදැයි පැහැදිලි කරන්න. (ලකුණු 02යි)

II. (අ) ඇපේඩ සමාගම ක්ෂේත්‍රය තුළ ප්‍රමුඛයා බවට පත්වීමට බලපා ඇතැයි සිතිය හැකි සාධක දෙකක් මෙම සිද්ධිය තුළින් නම් කරන්න. (ලකුණු 02යි)

(ආ) සේවක අභිප්‍රේරණ ක්‍රම වර්ග කර ඉහත සිද්ධිය තුළ කුමන අභිප්‍රේරණ ක්‍රමයක් පවතින්නේ දැයි නම් කරන්න. (ලකුණු 02යි)

III. ආයතනයේ කළමනාකරණ මට්ටම දක්වා එම කළමනාකරණ මට්ටම්වලට අදාළ කළමනාකරුවන් සතු කුසලතා අතර සම්බන්ධතාවය පෙන්වා දෙන්න. (ලකුණු 04යි)

IV. "ආයතනයක තොග සම්බන්ධව මුලු පිරිවැය අවම වන පරිදි වරකට ඇනවුම් කළ යුතු තොග ඒකක ප්‍රමාණය ආර්ථික ඇනවුම් ප්‍රමාණය වේ"(EOQ)

(අ) ව්‍යාපාරයක මුළු තොග පිරිවැය වර්ග කර ඒවා කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02යි)

(ආ) පරිප්පු තොග පවත්වාගෙන යන අලෙවි මධ්‍යස්ථානයක තොග පවත්වාගෙන යාමට අදාළ වියදම් සම්බන්ධ තොරතුරු පහත දැක්වේ. වටිනාකම රුපියල් දහස්වලිනි.

- එක් ඇනවුමක් සඳහා පිරිවැය රුපියල් 50කි.
- කාලච්ඡේදයේ තොග අවශ්‍යතාව ඒකක 1000කි
- එක් ඒකකයක් කාලච්ඡේදය පුරා පවත්වාගෙන යාමට රුපියල් 100කි

ඉහත තොරතුරු ඇසුරින් ආර්ථික ඇනවුම් ප්‍රමාණය සමීකරණයකින් ගණනය කරන්න. (ලකුණු 02යි)

V. (අ) මෙහෙයුම් කළමනාකරු විසින් ද්‍රව්‍ය මිලදී ගැනීමේදී සැලකිලිමත් විය යුතු කරුණු මොනවාද? (ලකුණු 02යි)

(ආ) ආයතනයක ගුණත්ව පාලනය මෙහෙයුම් කළමනාකරණයේදී ,ආයතනයකට වැදගත් වන්නේ කෙසේදැයි පෙන්වා දෙන්න. (ලකුණු 02යි)

06. I. (අ) සන්නමක් යන්න පැහැදිලි කර සන්නමක තිබිය යුතු ගුණාංග දෙකක් ලියන්න. (ලකුණු 02යි)

(ආ) සන්නමකින් ව්‍යාපාරිකයෙකුට ලැබෙන ප්‍රයෝජන විස්තර කරන්න. (ලකුණු 02යි)

II. (අ) 1 ඇසුරුමක මූලික කාර්ය කුමක්ද? (ලකුණු 01යි)

2 ඇසුරුමක මට්ටම් තුන නම් කරන්න. (ලකුණු 01යි)

(ආ) ඇසුරුමක් සැලසුම් කිරීමේදී අවධානය යොමු කළ යුතු කරුණු මොනවාද? (ලකුණු 02යි)

III. (අ) ප්‍රවර්ධන මිශ්‍රය පැහැදිලි කරන්න. (ලකුණු 02යි)

(ආ)ව්‍යාපාරයක අලෙවිය වැඩිකරගැනීම සඳහා ඉසව් හා අත්දැකීම් ඉවහල් කර ගන්නේ කෙසේදැයි කෙටියෙන් පෙන්වා දෙන්න. (ලකුණු 02යි)

IV. නිෂ්පාදිත පාරිභෝගිකයා වෙත ලබා කර දීමේ ක්‍රියාවලිය බෙදා හැරීම වේ. නිෂ්පාදිත බෙදා හැරීමේ මාර්ග නම්කර බෙදාහැරීමේ ක්‍රමයක් තීරණය කිරීමේ දී අවධානය යොමු කළ යුතු කරුණු මොනවාදැයි දක්වන්න? (ලකුණු 04යි)

V. (අ) නූතන භුවමාරු ආර්ථිකය තුළ වෙළඳපොළ විවිධාකාරයෙන් දැකිය හැකිය. නූතන භුවමාරු ආර්ථිකය යටතේ භාවිතා වන මූලික වෙළෙඳපොළ කොටස් නම් කරන්න. (ලකුණු 02යි)

(ආ) ව්‍යාපාරිකයෙකුට සාර්ථක අලෙවිකරණයක් සඳහා අලෙවිකරණ මිශ්‍රයේ ඇති වැදගත්කම පෙන්වා දෙන්න. (ලකුණු 02යි)

07."මනහර සමාගම වසර ගණනක ඉතිහාසයක් සහිත සපත්තු නිෂ්පාදන සමාගමකි. වසර ගණනකින් සේවක වැටුප ඉහළ නංවා නොමැති අතර, සේවකයින් වැඩට නොපැමිණීම, සේවයෙන් ඉවත්වීම නිසා වෙළඳපොළ ඉල්ලුම සපුරාලීමට නොහැකි වී ඇත''

I. (අ) මානව සම්පත් කළමනාකරණයේ සුවිශේෂී අරමුණු හතරක් සඳහන් කරන්න. (ලකුණු 02යි)

(ආ) යහපත් සේව්‍ය සේවක සබඳතා ව්‍යාපාරවලට අත්කර දෙන වාසි හතරක් සඳහන් කරන්න. (ලකුණු 02යි)

II. ''සේවකයින් කුමන ක්‍රමයකට තෝරා ගත්ත ද සේවකයින් තෝරා ගැනීමේදී සලකා බැලිය යුතු කරුණු කිහිපයකි''

(අ) සේවකයින් තෝරාගැනීමේදී සලකා බැලිය යුතු කරුණු සඳහන් කරන්න. (ලකුණු 02යි)

(ආ) සේවකයින් තෝරා ගැනීමෙන් පසු ව්‍යාපාර සංවිධානයක සිදුවන මානව සම්පත් කාර්යය හතරක් සඳහන් කරන්න. (ලකුණු 02යි)

III. "සේවක පුහුණුව හා සංවර්ධනය සේවා යෝජකයාට මෙන්ම සේවකයාටද ප්‍රතිලාභ අත්කර දෙයි."

(අ) පුහුණුව හා සංවර්ධනය සේවකයාට අත්කරගෙන ප්‍රතිලාභ සඳහන් කරන්න. (ලකුණු 02යි)

(ආ)පුහුණුව, කළමනාකරණ නොවන සේවකයින්ටද, සංවර්ධනය කළමනාකරුවන්ට ද අවශ්‍ය වේ යැයි පවසයි. පුහුණුව හා සංවර්ධනය සසඳමින් මෙම අදහස තහවුරු කරන්න. (ලකුණු 02යි)

IV. ''ආයතනයක සේවකයින්ට අයිතිවාසිකම් මෙන්ම යුතුකම් ද පවතී."

(අ) සේවක යුතුකම් හතරක් සඳහන් කරන්න. (ලකුණු 02යි)

(ආ) සේවක වැඩ වර්ජන ආර්ථිකයට සිදුකරන අහිතකර බලපෑම් හතරක් සඳහන් කරන්න. (ලකුණු 02යි)

V. "ව්‍යාපාරයක තොරතුරු පද්ධති වැදගත් කාර්යයන් ඉටු කරයි."

(අ) තොරතුරු පද්ධතියක් යන්න හඳුන්වන්න. (ලකුණු 02යි)

(ආ) ඵලදායී තොරතුරු පද්ධතියක කාර්යයන් හතරක් සඳහන් කරන්න. (ලකුණු 02යි)

08." දත්ත තොරතුරු බවට පරිවර්තනය කිරීම ක්‍රියාවලියක් ලෙස සිදුවෙයි."

1. (අ) දත්ත සැකසුම් ක්‍රියාවලියට අයත් කාර්යය නම් කර කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02යි)

(ආ) තොරතුරු තාක්ෂණයේ ප්‍රතිලාභ හතරක් සඳහන් කරන්න. (ලකුණු 02යි)

II.''ව්‍යාපාර වලට සමාජ මාධ්‍ය සෑම විටම අවස්ථා ඇති නොකරයි''

(අ) සමාජ මාධ්‍ය ව්‍යාපාර වලට ඇතිකරන අවාසිදායක තත්ත්ව දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02යි)

(ආ) අන්තර්ජාලය මගින් සපයන සේවා හතරක් නම් කර දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 02යි)

III. අලුතින් ආරම්භ කරන ලද ව්‍යාපාරයක් වෙනුවෙන් දැරීමට සිදුවන ආරම්භක වියදම් හතරකට උදාහරණ සඳහන් කරන්න. (ලකුණු 04යි)

IV. විධායක සාරාංශයක අඩංගු කරුණු හතරක් සඳහන් කරන්න. (ලකුණු 04යි)

V. කෘතිම බුද්ධිය ව්‍යාපාරවලට යොදාගන්නා අවස්ථා හතරක් සඳහන් කරන්න. (ලකුණු 04යි)

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

13 ශ්‍රේණිය අවසාන වාර පරීක්ෂණය - 2024
தரம் 13 ஆண்டிறுதிப் பரீட்சை - 2024 / Grade 13 Final Term Test - 2024

ව්‍යාපාර අධ්‍යයනය - I	32	S	I	කාලය / நேரம் / Time } පැය 2

නම / பெயர் / Name } .... විභාග අංකය / சுட்டிலக்கம் / Index No. } ....

උපදෙස් -

1. සියළුම ප්‍රශ්න වලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.
2. ප්‍රශ්න අංක 1 සිට 30 තෙක් වූ ප්‍රශ්ණ සඳහා නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.
3. ප්‍රශ්න අංක 31 සිට 50 දක්වා වූ ප්‍රශ්න සඳහා කෙටි පිළිතුරු අදාළ තිත් ඉර මත ලියන්න.
4. සෑම ප්‍රශ්නයකටම සමාන ලකුණු හිමිවේ.

---

1. පහත සඳහන් වන්නේ සිද්ධි කිහිපයකි.

A - නමරා තම ගෙවත්තේ එළවළු වගා කර දිනපතා පරිභෝජනයට ලබා ගැනීම.
B - කුමාර තමා සතු වෑන් රථය තම මාමාට විකිණීම.
C - නදුන් ළමා ඇඳුම් තොග වශයෙන් මිලදීගෙන සිල්ලර වෙළඳසැල්වලට විකිණීම.
D - සුපුන් විසිතුරු මල් වර්ග වගාකර මල් ප්‍රදර්ශනවලට සහභාගි වී අලෙවි කිරීම.
ඉහත සිද්ධි අතරින් ව්‍යාපාර ගති ලක්ෂණ පිළිබිඹු වන සිද්ධි පමණක් ඇතුළත් වරණය තෝරන්න.

1. A හා B   2. C හා D   3. B හා C   4. A හා C   5. B හා D

(...........)

2. ව්‍යාපාර පරිසර බලවේගවලට අයත් සාධක කිහිපයක් පහත වේ.

A - අයිතිකරු සතු ප්‍රාග්ධනය.
B - කළමනාකරුවන්ගේ පලපුරුද්ද.
C - පාරිභෝගිකයන්ගේ ආදායම අඩුවීම.
D - ජනගහන වර්ධන අනුපාතය අඩුවීම.
E - ආදේශන භාණ්ඩ වෙළෙඳපොළට පැමිණීම.
F - නව තාක්ෂණික සොයා ගැනීම.

ඉහත සාධක අතරින් ව්‍යාපාරයකට තර්ජන එල්ල කළ හැකි සාධක පමණක් ඇතුළත් වරණය තෝරන්න.

1. A,B, E,F   2. A,C,E,F,   3.A,C,D,E   4. C,D,E,F   5. A,B,D,F

(...........)

3. ව්‍යාපාරයක් විසින් ඉටු කළ යුතු සමාජ වගකීම් කිහිපයක් පහත දැක්වේ .

- සාධාරණ වීම.
- හානි අවම වීම.
- අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

මෙම සමාජ වගකීම් ඉටුකල යුත්තේ මින් කුමන පාර්ශ්වයටද?

1. සමාජය   2. අයිතිකරුවන්   3. සේවකයන්   4.සැපයුම් කරුවන්   5.ගනුදෙනුකරුවන්

(...........)

4. තිරසර සංවර්ධනය හා සම්බන්ධ ක්‍රියාකාරකම් කිහිපයක් පහත දැක්වේ.

A - සේවක සුබ සාධනය.
B - මානව විවිධත්වයට ගරු කරමින් කටයුතු කිරීම.
C- පාර්ශව කරුවන්ගේ ප්‍රතිලාභ වර්ධනය කිරීම.
D - පරිසර හිතකාමී බලශක්ති භාවිතය.
E- හුවමාරුව හා ගනුදෙනු ක්‍රියාවලිය දියුණු කිරීම.
F - නීතිය හා සාමය සුරැකීමට දායකවීම.

මෙම ක්‍රියාකාරකම් අතුරින් ව්‍යාපාර ආයතන ආර්ථිකව තිරසර බව තහවුරු කර ගැනීම සඳහා කළ හැකි ක්‍රියාකාරකම් පමණක් ඇතුළත් වරණය කුමක්ද?

1. A C E 2. B C E 3. C D F 4. B D F 5. C D E

(...........)

5. කිසියම් භාණ්ඩයක කල් ඉකුත් වීමේ දිනය ,සඳහන් නොකිරීම තුළින් උල්ලංඝනය වන්නේ පාරිභෝගිකයාගේ කුමන අයිතිවාසිකම ද?

1. මූලික අවශ්‍යතා සපුරා ගැනීමට ඇති අයිතිය.
2. ආරක්ෂාව සලසා ගැනීමට ඇති අයිතිය.
3. තොරතුරු දැනගැනීමට ඇති අයිතිය.
4. පාරිභෝගික අධ්‍යාපනයට ඇති අයිතිය.
5. තෝරාගැනීමට ඇති අයිතිය.

(...........)

6. පහත සඳහන් කාණ්ඩ අතුරින් වක්‍ර බදු පමණක් ඇතුළත් කාණ්ඩය තෝරන්න.

1. සමාගම් බදු, එකතු කළ අගය මත බදු, නිෂ්පාදන බදු
2. රේගු බදු, නිෂ්පාදන බදු, එකතු කළ අගය මත බදු
3. සමාගම් බදු, ප්‍රාග්ධන ලාභ මත බදු, රේගු බදු
4. ආදායම් බදු, රඳවා ගැනීමේ බදු, සමාගම් බදු
5. නිෂ්පාදන බදු, සමාගම් බදු, ආනයනය මත බදු

(...........)

7. පහත දැක්වෙන්නේ සංස්ථාපිත සමාගම්වලට අදාළ ලක්ෂණ කිහිපයකි.

A - වගකීම සීමිත වීම.
B - උපරිම සාමාජික සංඛ්‍යාව සීමාවක් නොමැති වීම.
C - අවම අධ්‍යක්ෂවරු සංඛ්‍යාව දෙදෙනෙකු වීම.
D - අඛණ්ඩ පැවැත්මක් තිබීම.
E - අවම සාමාජික සංඛ්‍යාව එකක් වීම.
F - නෛතික පුද්ගලභාවයක් පැවතීම.
G - කොටස් හෝ සුරැකුම්පත් ප්‍රසිද්ධියේ නිකුත් කළ හැකිවීම.

ඉහත ලක්ෂණවලින් සීමිත පෞද්ගලික සහ සීමිත පොදු යන සමාගම් වර්ග දෙකටම අදාළ පොදු ලක්ෂණ ඇතුළත් පිළිතුරු කාණ්ඩය තෝරන්න.

1. A,B,C,හා G 2. A,C,D හා ,E 3. B,E,F හා ,G 4. A,D,E හා ,F 5. C,D,E හා ,G

(...........)

8. අප රටෙහි ව්‍යාපාර ක්ෂේත්‍රය තුළ රාජ්‍ය සංස්ථා පවත්වාගෙන යාමට ප්‍රධාන වශයෙන් බලපා ඇත්තේ,

1. රජයේ ඒකාධිකාරිය ගොඩනගා ගැනීමට.
2. රජයට ආදායම් ලබාගැනීමට.
3. ලාභදායී නොවන අත්‍යවශ්‍ය සේවා පවත්වාගෙන යාමට.
4. රැකියා සුරක්ෂිතතාව තහවුරු කර ගැනීමට.
5. භාණ්ඩ හා සේවාවල ගුණත්වය වර්ධනය කිරීමට.

(...........)

9. පහත දැක්වෙන්නේ ව්‍යවසායකත්ව ක්‍රියාවලියට අයත් පියවර හා සම්බන්ධ සටහනකි.



මෙම ක්‍රියාවලියෙහි A හා B හිස් තැන් වලට ගැලපෙන පියවර පිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.

1. ප්‍රතික්‍රියා දැක්වීම , අවශ්‍ය සම්පත් සම්පාදනය.
2. අවශ්‍ය සම්පත් සම්පාදනය, අවදානම් කළමනාකරණය.
3. ශක්‍යතා අධ්‍යයනය සිදුකිරීම, යථාර්ථයක් බවට පත්කර ගැනීම.
4. යථාර්ථයක් බවට පත්කර ගැනීම, යටිතල පහසුකම් සම්පාදනය.
5. අවශ්‍ය සම්පත් සම්පාදනය, යථාර්ථයක් බවට පත්කර ගැනීම.

(...........)

10. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට වෙළඳපොළ තුළ සාර්ථකව රැඳී සිටිය හැක්කේ,

1. මහා පරිමාණ ව්‍යාපාර උනන්දු නොවන, වෙළඳපොළවලට ප්‍රවේශවීමෙන්ය.
2. මහා පරිමාණ ව්‍යාපාර සමඟ තරග කිරීමෙන්ය.
3. අපනයනාභිමුඛ ව්‍යාපාරවල නිරත වීමෙන්ය.
4. සාම්ප්‍රදායික තාක්ෂණය භාවිත කිරීමෙන්ය.
5. ප්‍රවර්ධන උපාය මාර්ග බහුලව යොදා ගැනීමෙන්ය.

(...........)

11. ශ්‍රී ලංකාවේ මූල්‍ය ආයතන වර්ග සහ එයට අයත් වන මූල්‍ය ආයතන කිහිපයක් පහත වගුවේ දැක්වේ .

මූල්‍ය ආයතන වර්ගය	මූල්‍ය ආයතනය
I. බැංකු අංශය	A. සමූපකාර ග්‍රාමීය බැංකුව
II. තැන්පතු භාරගන්නා අනෙකුත් මූල්‍ය ආයතන	B. ප්‍රාථමික අලෙවිකරුවන්
III. විශේෂිත මූල්‍යායතන	C. රක්ෂණ සමාගම්
IV. ගිවිසුම්ගත ඉතිරි කිරීමේ ආයතන	D. බලපත්‍රලාභී විශේෂිත බැංකු

ඉහත දී ඇති මූල්‍ය ආයතන වර්ගවල අනුපිළිවෙළ අනුව අදාළ මූල්‍ය ආයතන නිවැරදිව ගලපා ඇති වරණය කුමක් ද?

1. A DCB   2. DABC   3. BCDA   4. BDCA   5.ACBD

(...........)

12. චෙක් පතක රේඛනය තුළ ගනුදෙනු කළ නොහැක යන පදය යෙදීමෙන් අදහස් වන්නේ,

1. එම චෙක් පතෙහි නම සඳහන් ආදායකයාගේ ගිණුමකට පමණක් තැන්පත් කළ හැකි බවයි.
2. එය පැවරීමේ දී පැවරුම්ලාභියාට පැවරුම්කරුට වඩා වැඩි අයිතියක් හිමිවන බවයි.
3. එය පිටසන් කිරීමකින් තොරව පැවරිය හැකි බවයි.
4. එය පැවරීමේ දී පැවරුම්කරුට තිබූ අයිතියට වඩා වැඩි අයිතියක් පැවරුම්ලාභියාට හිමි නොවන බවයි.
5. එම චෙක් පත තවදුරටත් පැවරීම සීමා කර ඇති බවයි.

(...........)

13. පහත දැක්වෙන්නේ සන්නිවේදන මාධ්‍ය කිහිපයක වාසි කිහිපයකි.

A - තොරතුරු වල නිරවද්‍යතාවය ඉහළ මට්ටමක පැවතීම.

B - තොරතුරු කෙටියෙන් පැහැදිලිව ඉදිරිපත් කළ හැකිවීම.

C - තොරතුරු දෙන්නා හා ලබන්නා සම්මුඛ වීම.

D - දත්ත, සටහන් වගු ආදිය පහසුවෙන් සන්නිවේදනය කළ හැකිවීම.

E – තොරතුරු පහසුවෙන් අවබෝධ කර ගත හැකි වීම.

මින් සංඥා හා සංකේත මාධ්‍යයට අදාළ වන වාසි ඇතුළත් වරණය කුමක්ද?

1. ACD 2. CDE 3.ABE 4. BCD 5.ACE

(...........)

14. විවිධ පාර්ශ්වයන්ට ප්‍රවාහනය වැදගත් වන ආකාරයන් කිහිපයක් පහත දැක්වේ.

A - විනෝද චාරිකා සඳහා අවස්ථාව ලැබීම.

B - ජාත්‍යන්තර සබඳතා වර්ධනය වීම.

C - සේවකයන් නියමිත වේලාවට ගෙන්වා ගැනීම

D - පර්යේෂණ ගවේෂණ හා අධ්‍යාපන කටයුතු සඳහා.

E - විදේශ වෙළඳාම වර්ධනය වීම.

F - වෙළඳපොළ ව්‍යාප්තියට.

ඉහත දක්වා ඇති ප්‍රකාශන පුද්ගලයින්ට, ආර්ථිකයට හා ව්‍යාපාරිකයන් ආදී විවිධ පාර්ශ්වයන්ට වැදගත් වන ආකාරය පිළිවෙලින් දැක්වූ විට පිළිතුර වන්නේ

1. AD,BF,CE 2. AB,CD, EF 3.AC,DE,BF 4. AE,BC,DF, 5. AD,BE,CF

(...........)

15. ලෝකයේ රටවල් අතර වෙළඳ කලාප පිහිටුවා ගනු ලැබීමේ අරමුණ වන්නේ,

1. සාමාජික රටවල විදේශ වෙළඳාමේ ස්වභාවය විශ්ලේෂණය ට.
2. සාමාජික රටවල් අතර නිදහස් වෙළඳාම ප්‍රවර්ධනයට
3. සාමාජික රටවල් අතර තරගකාරීත්වයක් ඇති කිරීමට.
4. සාමාජික රටවල් වෙනත් රටවල් සමග කෙරෙන වෙළඳ ගනුදෙනු අවම කිරීමට.
5. සාමාජික රටවල දිළිඳුකම පිටුදැකීමට.

(...........)

16. සැලසුම් කරණ ක්‍රියාවලිය හා සංවිධානකරණ ක්‍රියාවලියට, අයත් පියවර කිහිපයක් පහත දැක්වේ.

A -අරමුණු හා පරමාර්ථ හඳුනා ගැනීම.

B - වැඩ කිරීමේ ප්‍රමිත ඇති කිරීම.

C - සම්පත් විශ්ලේෂණය.

D - සම්පත් බෙදා හැරීම.

E - කාර්ය සාධන පරාසය හඳුනා ගැනීම හා විශ්ලේෂණය.

F - වැඩ බෙදීම.

G - පරිසර විශ්ලේෂණය.

H - පරමාර්ථ ස්ථාපිත කිරීම.

I - වැඩ කිරීමේ ප්‍රමිත ඇතිකිරීම.

ඉහත දැ අතරින් සැලසුම්කරණයට අයත් පියවර පමණක් ඇතුළත් වරණය කුමක්ද?

1. ACEGH 2.ABCHG 3. BCHGI 4.BEDHI 5.BIHGE

(...........)

17. ව්‍යාපාර ආයතනයක හිමිකරුවකු වන චමිඳු ගුණරත්න මහතා පවසන්නේ තමා ආයතනය හිමිකරු බැවින් ආයතනයේ සියලුම කටයුතු පිළිබඳ තමාම තීරණය ගන්නා බවත් එම තීරණ ක්‍රියාත්මක කිරීමට ආයතනයේ සියලු අංශවල ප්‍රධානීන් හා සේවකයින් බැඳී සිටිය යුතු බවත්ය මෙ තත්ත්වය හඳුන්වන්නේ,

1. විමධ්‍යගත කිරීම ලෙසය.
2. බලය බෙදා හැරීම ලෙසය.
3. මධ්‍යගත කිරීම ලෙසය.
4. විධානදීමේ ඒකීයතාවය ලෙසය.
5. ප්‍රජාතන්ත්‍රවාදී තීරණ ගැනීමක් ලෙසය.

(...........)

18. භාණ්ඩයක ගුණත්වය, අංගෝපාංග කිහිපයකින් සමන්විත වේ. එවැනි අංගෝපාංග පමණක් ඇතුළත් නිවැරදි පිළිතුර තෝරන්න.

1. නෛතික බව/ මනා ක්‍රියාකාරිත්වය / කල් පැවැත්ම/ ශූන්‍ය දෝෂ / උචිත බව
2. මනා ක්‍රියාකාරිත්වය/ උචිත බව/ කල් පැවැත්ම/ ආරක්ෂිත බව/ ශූන්‍ය දෝෂ/ ප්‍රමිතියට අනුකූල වීම
3. මනා ක්‍රියාකාරිත්වය/කල් පැවැත්ම / ප්‍රමිතියට අනුකූල බව/ උචිත බව/ආරක්ෂිත බව/ විශ්වාසවන්ත භාවය
4. ප්‍රමිතියට අනුකූල බව/ ආරක්ෂිත බව/නෛතික බව/ කල් පැවැත්ම/ උසස් තත්ත්ව/ මනා ක්‍රියාකාරිත්වය
5. උචිත බව/ ප්‍රමිතියට අනුකූල බව/ආරක්ෂිත බව/කල් පැවැත්ම/ නෛතික බව/ ශූන්‍ය දෝෂ

(..........)

19. නිෂ්පාදන ක්‍රමයක් තෝරා ගැනීමේදී අවධානය යොමු කළ යුතු නිර්ණායක වන්නේ,

1. නිපදවීම තොග සඳහාද/ නිෂ්පාදිතයේ ස්වභාවය දැරිය යුතු පිරිවැය/ නිෂ්පාදිත පෙළ
2. නිමයුම් පරිමාණය/නිෂ්පාදිත පෙළ/ නිපදවීම ඇනවුමට ද ,තොග සඳහාද/ නිෂ්පාදන ක්‍රියාවලියේ නම්‍යශීලි බව
3. නිමයුම් පරිමාණය/ දැරිය යුතු පිරිවැය/ නිපදවන්නේ ඇණවුමට ද/මිලදී ගැනීමේ රටාව
4. වෙළඳපොළ ප්‍රමාණය/ සම්පත් ලබා ගැනීමේ පහසුව/ නිපදවන්නේ ඇනවුමට ද /දැරිය යුතු පිරිවැය
5. නිෂ්පාදිතයේ ස්වභාවය/ වෙළඳපොළ ප්‍රමාණය/ දැරිය යුතු පිරිවැය/ සම්පත් ලබා ගැනීමේ පහසුව

(..........)

20. සාකල්‍යවාදී අලෙවි කරන සංකල්පයේදී අවධානය යොමු කරන අංශ හා ඒවාට අදාළ විස්තර හතරක් පහත දැක්වේ.

අංශ	විස්තරය
1. කාර්ය සාධන අලෙවිකරණය	A. ව්‍යාපාරයේ සියලුම ඇල්මැති පාර්ශවයන් දිගු කාලීනව දෙපාර්ශ්වයටම ප්‍රතිඵලදායි සම්බන්ධතා ගොඩනැගීම.
2. අභ්‍යන්තර අලෙවිකරණය	B. ආයතනයේ සියලුම කළමනාකරුවන්ගේ හා සේවකයින්ගේ කාර්ය අලෙවි කරන කාර්ය හා සමායෝජනය විය යුතු බවයි.
3. සම්බන්ධතා ලෙවිකරණය	C. ඉහළ කළමනාකරුවන්ගේ සිට පහළම සේවකයා තෙක් ගනුදෙනුකරුවාට හොඳ සේවාවක් ලබාදීමට සහයෝගයෙන් හා සක්‍රියව එකතුවීමයි.
4. සමෝධානික අලෙවිකරණය	D. අලෙවිකරණ වැඩසටහන් හා ක්‍රියාමාර්ග සැකසීමේදී සමාජ වගකීම් ආචාරධර්ම හා පරිසරය පිළිබඳ අවධානය යොමු කර තිබිය යුතුය.

ඉහත දී ඇති සාකල්‍යවාදී අලෙවි කරන සංකල්පයේදී අවධානය යොමු කරන අංශ අනුපිළිවෙල අනුව ඒවාට අදාළ විස්තර නිවැරදිව ගලපා ඇති වරණය කුමක්ද?

1. A BCD   2.BCDA   3. CBDA   4. DCAB   5.DABC

(..........)

21. සේවක පුහුණුව හා සැසඳීමේදී සේවක සංවර්ධනය යන්නෙන් අදහස් කරන්නේ,

1. ඉතා පුළුල් පරාසයක දිවයන වැඩසටහනකි.
2. අඩු පිරිවැයක් දැරිය යුතු වැඩසටහනකි.
3. වර්තමාන රැකියාවට සේවකයා සූදානම් කිරීමකි.
4. සේවක පිරිවැටුම ඉහළ නංවන්නකි.
5. කෙටි කාලීන වැඩසටහනකි.

(..........)

22. සේවකයාට පරිවාස කාලය තුළ සිය කටයුතු නිසියාකාරව ඉටු කිරීමට නොහැකිවීම නිසා කළමණාකාරිත්වයට ගත හැකි ක්‍රියාමාර්ගයක් නොවන්නේ,

1. සේවය අවසන් කිරීම.
2. වාචික හා ලිඛිතව අවවාද කිරීම.
3. දඬුවම් ලබාදීම.
4. සේවකයාට එරෙහිව අධිකරණයට යාම.
5. පරිවාස කාලය දීර්ඝ කිරීම.

(..........)

23. සාමූහික කේවල් කිරීම යන්නෙන් අදහස් කරන්නේ,
1. යම් සම්මුතියකට එළඹීම සඳහා වෘත්තීය සමිති නියෝජිතයින් අතර කෙරෙන සාකච්ඡා කිරීමකි.
2. යම් සම්මුතියකට එළඹීම සඳහා සේවා සංගම්වල සාමාජිකයින් අතර සිදුවන සාමූහික සාකච්ඡාවකි.
3. සේවා යෝජකයින් හා සේවක වෘත්තීය සමිති අතර වෘත්තීය ප්‍රශ්නයක් විසඳීමට කිසියම් සම්මුතියකට එළඹීම සඳහා සිදුකරනු ලබන සාමූහික සාකච්ඡාවකි.
4. යම් සම්මුතියකට එළඹීම සඳහා වෘත්තීය සමිති නියෝජිතයින් හා රජය අතර කෙරෙන සාකච්ඡාවකි.
5. වෘත්තීය ප්‍රශ්නයක් නිරාකරණය කර ගැනීම සඳහා සේවා යෝජකයින් හා කම්කරු කොමසාරිස්වරයා අතර ඇතිවන සාකච්ඡාවකි.

(...........)

24. පහත දැක්වෙන්නේ සීමාසහිත පොදු සමාගමක මූල්‍ය සම්පාදන මාර්ග කිහිපයකි.
A - බැංකු අයිරා
B - කොටස් නිකුතුව
C - බැංකු ණය
D - ක්ෂය සඳහා වෙන් කිරීම
E - කල්බදු
F - සාධ්‍යකරණය
G - රඳවා ගත් ලාභ
H - ණයකර නිකුතුව
ඉහත මූල්‍ය සම්පාදන මාර්ග අතුරින් ඍජු මූල්‍ය සම්පාදන මාර්ග පමණක් ඇතුළත් වරණය කුමක්ද?

1. AFDG 2. BFCG 3. AE FH 4. BDGH 5. EBFG

(...........)

25. මූල්‍ය උපකරණවල කල් පිරීමේ කාලය අනුව මූල්‍ය වෙළඳපොළ නිවැරදිව වර්ග කර ඇති වරණය කුමක් ද?
1. ප්‍රාථමික වෙළඳපොළ හා ද්විතියික වෙළඳපොළ
2. ණය වෙළඳපොළ හා මුදල් වෙළඳපොළ
3. භාණ්ඩාගාර බිල්පත් වෙළඳපොළ හා වාණිජ පත්‍රිකා වෙළඳපොළ
4. මුදල් වෙළඳපොළ හා ප්‍රාග්ධන වෙළඳපොළ
5. ණය උපකරණ වෙළඳපොළ හා හිමිකම් උපකරණ වෙළඳපොළ

(...........)

26. කොළඹ කොටස් හුවමාරුවේ ගනු දෙනු වන සුරැකුම් පත් පමණක් ඇතුළත් කාණ්ඩය වන්නේ,
1. රජයේ සුරැකුම්පත්. සාංගමික ණය කර,වරණීය කොටස් ,කොටස් බලපත්‍රය,සාමාන්‍ය කොටස්
2. කොටස් බලපත්‍රය , සාමාන්‍ය කොටස් ,රජයේ සුරැකුම් පත්,සාංගමික ණයකර,කොටස් සහතික පත්‍ර.
3. කොටස් සහතික පත්‍රය, වරණීය කොටස්,සාංගමික ණයකර,කොටස් බලපත්‍රය,වරණීය කොටස්
4. වාණිජ පත්‍රිකා,රජයේ සුරැකුම්පත්,සාමාන්‍ය කොටස්,තැන්පතු සහතික, වරණීය කොටස්
5. භාණ්ඩාගාර බැඳුම්කර,සාංගමික බැඳුම්කර,පොරොන්දු නෝට්ටු,වරණීය කොටස්,සාමාන්‍ය කොටස්

(...........)

27. පහත වගුවේ දැක්වෙන්නේ තොරතුරු පද්ධති හා ඒවා භාවිතා කරන මට්ටමය.

තොරතුරු පද්ධති	භාවිතා කරන මට්ටම
A. කාර්යාල ස්වයංකරණ පද්ධති.	1. කළමනාකරණ මට්ටම.
B. ගනුදෙනු සැකසුම් පද්ධති.	2. උපක්‍රමික මට්ටම.
C. තීරණ උපකාරක පද්ධති.	3. දැනුම් මට්ටම.
D. විධායක උපකාරක පද්ධති	4. මෙහෙයුම් මට්ටම.

ඒ ඒ තොරතුරු පද්ධති භාවිතාකරන මට්ටම නිසි පරිදි ගැලපූ විට ලබා ගත හැකි නිවැරදි පිළිතුර වන්නේ,

1. A – 4	B – 3	C – 2	D - 1
2. A – 3	B - 4	C – 1	D - 2
3. A – 2	B – 3	C – 4	D - 1
4. A – 4	B – 3	C – 1	D - 2
5. A – 1	B - 3	C - 2	D - 1

(...........)

28. අන්තර්ජාලය තුලින් එක් තැනකින් සම්බන්ධ වී තවත් තැනක ඇති පරිගණකයක් භාවිතාකිරීමට ඇති පහසුකම හඳුන්වන්නේ මින් කවර නමකින්ද ?

1. පුවත් කණ්ඩායම්. (News Group)
2. සෙවුම් යන්ත්‍ර (Search Engines)
3. වලාකුළු පරිගණක තාක්ෂණය.(cloud computing)
4. ගොනු හුවමාරු නියමාවලිය.(File transfer protocol)
5. ටෙලිපරිගණක (tele computing)

(............)

29. ව්‍යාපාර සැලැස්මක අංගයක් වන විධායක සාරාංශයේ මූලික පරමාර්ථය වන්නේ,

1. ව්‍යාපාරයේ මූල්‍ය ශක්‍යතාවය පිළිබද ඇල්ම ඇති පාර්ශවයන්ට අවබෝධය ලබා දීම.
2. ව්‍යාපාරයේ අනාගත අවශ්‍යතා හා පිරිවැය පුරෝකථනය කිරීමයි.
3. බාහිර පාර්ශව ව්‍යාපාරය පිළිබද තව දුරටත් සොයාබැලීමට පෙළඹවීමයි.
4. ව්‍යාපාරයේ ස්වභාවය පිලිබද හදුන්වා දීමයි.
5. ව්‍යාපාරයේ උපායමාර්ග පිළිබදව බාහිර පාර්ශව දැනුවත් කිරීමයි

(..........)

30. මූල්‍ය සැලැස්මක, එක් එක් අංගවල ඇතුළත් කරුණු කිහිපයක් පහත දැක්වේ.

A - මෙහෙයුම් පෙර වියදම්
B – ක්‍රියාකාරී ප්‍රතිලාභය
C - මුළු ස්ථාවර පිරිවැය
D – විකුණුම් ආදායම
E - මුළු කාරක ප්‍රාග්ධනය
F - අයිතිකරුවන්ගේ ප්‍රාග්ධනය

ඉහත කරුණු අතරින් ඇස්තමේන්තු ගත ව්‍යාපෘති පිරිවැයට අයත් කරුණු පමණක් ඇතුළත් වරණය කුමක් ද?

1. A ,C,E 2. B,C,D 3. C, D,F 4 . C,D,E 5. B,D,F

(............)

- අංක 31 -40 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.

31. අ) යම් නිෂ්පාදිතයක් සම්බන්ධයෙන් ගැණුම්කරුවන් හා විකුණුම් කරුවන් මුණගැසෙන හෝ සම්බන්ධ වන ඕනෑම .... වෙළදපොලක් වන අතර .... ඉටුකර ගැනීමට වෙළදපොල තුළින් භාණ්ඩ හා සේවා සපයා ගනී.
ආ)ආර්ථික තිරසර සංවර්ධනයේ දී ....අඩුකර .... උසස් කිරීම මගින් මානව සුභසාධනය ඉහළ නැංවීම අපේක්ෂා කෙරේ.

32. අ) ඇපයෙන් සීමිත සමාගමක් .... සිදු නොකරන අතර .... ද සිදු නොකරයි.
ආ)ලංකාව තුළ ව්‍යාපාර ස්ථානයක් පිහිටුවා ඇති නමුත් ලංකාවේ පිටත සංස්ථාපනය කර ඇති සමාගමක් .... නම් වන අතර යම් රටක සමාගමක් ලෙස සංස්ථාපනය කර එම රටින් පිටත ව්‍යාපාර කටයුතු සිදුකරන සමාගම් ....නමින් හඳුන්වයි.

33. අ) සුළු හා මධ්‍ය පරිමාන ව්‍යාපාර දිරිගැන්වීම සඳහා යටිතල පහසුකම් ....මගින් සපයන අතර විශිෂ්ටතා සම්මාන පිරිනැමීම .... මගින් සිදුකරයි.
ආ) ව්‍යවසායකයින්ට තම අනුගාමිකයින් ලවා කාර්යයන් ඉටුකරවා ගනිමින් විධිමත් ව මෙහෙයවීමට .... කුසලතාත් ව්‍යාපාරයේ අභ්‍යන්තර හා බාහිර පාර්ශව සමග මනා සම්බන්ධතාවයක් පවත්වාගෙන යාමට ....කුසලතාත් උපකාරී වේ.

34. (අ) ශ්‍රී ලංකාවේ පෞද්ගලික අංශය සඳහා පවතින විශාලතම අරමුදල.......................... වන අතර මෙය.......................... විසින් පරිපාලනය කරනු ලබයි.
(ආ) රක්ෂණ ආවරණයක් ලබා ගැනීමට අපේක්ෂා කරන පුද්ගලයා ඉදිරිපත් කරන.......................... රක්ෂණ ආයතනය විසින් පිළිගැනීමෙන් පසු එම දෙපාර්ශවය අතර ඇති කරගන්නා.......................... රක්ෂණ ගිවිසුමකි.

35.(අ) පොත්පත් හා ලිපි ලේඛන ගබඩා කරන ලේඛනාගාරයක අදාළ අයිතම ඇසිරීම හා ආපසු ලබාගැනීම සඳහා..................................යෝග්‍ය වන අතර පිරිවැය ඉතා ඉහළ ශීතාගාර ගබඩාවල භාණ්ඩ ඇසිරීම සඳහා.................................. යෝග්‍ය වෙයි.
(ආ) සමහර නිෂ්පාදිත ආනයනය කිරීමේදී.................................. විසින් නිකුත් කරන ආනයන බලපත්‍රයක් ලබාගත යුතු අතර ආනයන බලපත්‍ර අවශ්‍ය භාණ්ඩ තීරණය කරනු ලබන්නේ.................................. විසිනි.

36.(අ) සංවිධානයක සම්පත්, කාර්යයන්, බලතල වගකීම් බෙදී ගොස් ඇති ආකාරය.................................. ලෙස හැඳින්වේ. එහි එක් කළමනාකරුවකුට සෘජුවම වාර්තා කරනු ලබන සහායකයින් සංඛ්‍යාව ....වේ.
(ආ) ආයතනයක ඉහළ කළමනාකරණයේ සිට පහළ කළමනාකරණය තෙක් නොකැඩුණු අධිකාරී මාර්ගය .... වන අතර එක් සේවකයෙකු එක් සුපරීක්ෂකවරයෙකුට පමණක් වගකිවයුතුයි යන්න.................................. වේ.

37. (අ) සමාජ පංතිය වෙළඳපොළ බණ්ඩනය කිරීමෙ ....සාධකයක් ලෙසත් භාවිතා කරන ප්‍රමාණය සාධකයක්................................ ලෙසත් සැලකේ.
(ආ) හොඳ සන්නමක නිෂ්පාදිතයේ................................හා................................ වටිනාකම පිළිබඳව අදහසක් අන්තර්ගත වෙයි.

38.(අ) ආයතනයක පරමාර්ථ හා අරමුණු ඉටු කර ගැනීම සඳහා ආයතන................................ හා එම අවශ්‍යතා ඉටුකර ගැනීම පිණිස ගත යුතු................................ තීරණය කිරීම පිළිබඳ ක්‍රියාවලි මානව සම්පත් සැලසුම්කරනයයි.
(ආ) සංවිධානයක පරමාර්ථ හා අරමුණු ඉටුකර ගැනීම පිණිස සංවිධානයකට................................ හා................................ රැකියා අපේක්ෂකයින් ආයතනය වෙත අද්දවා ගැනීම සේවක ආකර්ෂණය වේ.

39.(අ) ව්‍යාපාරයක කෙටිකාලීන නුබුන්වත්බව හඳුනාගැනීමට................................අනුපාත ද වත්කම්වල අයෝජනය හා එයින් ජනිත කරන ඉපයීම අතර සම්බන්ධතාව හඳුනාගැනීමට................................ අනුපාත ද භාවිත කෙරේ.
(ආ) රටක මූල්‍ය ක්‍රමයේ සංවිධිත ක්‍රියාකාරීත්වය හා ස්ථායිතාවය තහවුරු කිරීම සඳහා ආධාර වන................................ හා................................ පද්ධති මූල්‍ය යටිතල පහසුකම් වේ.

40.(අ) දත්ත අංක ගණිතමය හෝ තර්කානුකූල හෝ ක්‍රියාවලියකට භාජනය කිරීම................................ වන අතර දත්ත වලින් යම් අදහසක් ඇති කරගත හැකි ආකාරයට කෙටි කර දැක්වීම................................ වෙයි.

(ආ) බාහිර පරිසර සාධක අනුව ව්‍යාපාර අදහස් ඇගයීමට ලක්කිරීම................................ ලෙස හඳුන්වන අතර එමගින් හඳුනාගත් ව්‍යාපාර අදහස් අතුරින් වඩාත් ප්‍රතිලාභ ලබන ව්‍යාපාර අදහස තෝරාගැනීම ට .... සිදුකළ යුතුය.

- අංක 41-50 තෙක් ප්‍රශ්නවලට නිශ්චිත පිළිතුරු සපයන්න.

41). ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය ප්‍රමිති ක්‍රියාත්මක කරන ආකාර හතරක් සඳහන් කරන්න.

1. ....
2. ....
3. ....
4. ....

42). ව්‍යාපාරයක් සඳහා යෝග්‍ය ව්‍යාපාර සංවිධාන ක්‍රමයක් තෝරා ගැනීමේදී අවධානය යොමු කළ යුතු සාධක හතරක් සඳහන් කරන්න.

1. ....
2. ....
3. ....
4. ....

43).ශ්‍රී ලංකා මහා බැංකුවේ නියෝජ්‍යායතන කාර්යයන් හතරක් ලියන්න.

1. ....
2. ....
3. ....
4. ....

44).ව්‍යාපාරයකට ප්‍රවාහන හා සැපයුම් සේවාවෙන් ලැබෙන ප්‍රයෝජන හතරක් ලියන්න.

1. ....
2. ....
3. ....
4. ....

45).පහත A,B,C හා D යන කාර්යයන් වල , නිරතවන නියෝජිත වර්ගය නම් කරන්න.

කාර්යයන්	නියෝජිත වර්ගය
A. ප්‍රධානියාට වාසිදායක වන ලෙස තම අභිමතය පරිදි ප්‍රධානියා වෙනුවෙන් භාණ්ඩ මිලදී ගැනීම හෝ විකිණීම සිදුකිරීම	1.
B. ප්‍රධානියා වෙනුවෙන් ණයට භාණ්ඩ විකිණීම කර එම ණය මුදල් අදාළ පාර්ශ්වයන්ගෙන් එකතු කර දීම	2.
C. ප්‍රධානියා වෙනුවෙන් භාණ්ඩ මිලදී ගැනීමේදී හෝ විකිණීමේදී , එම සිදුවන ගනුදෙනු තම පෞද්ගලික නාමින්ම සිදුකිරීම	3.
D. ගනුදෙනුවට අදාළ ගැනුම්කරු හා විකුණුම්කරු සම්මුඛ කරමින් ගනුදෙනුව සිදුවීමට අවශ්‍ය තොරතුරු සැපයීම	4.

46).ආර්ථික ඇනවුම් ප්‍රමාණය ගණනය කිරීම ආශ්‍රිත පහත ප්‍රස්ථාරයේ 1,2,3,4 මගින් දැක්වෙන්නේ මොනවාද?



1. ....
2. ....
3. ....
4. ....

47). අලෙවි කරන මිශ්‍රය ගනුදෙනුකරුගේ දෘෂ්ටියෙන් විචල්‍යයන් හතරක් ලෙස ඉදිරිපත් කළ හැකියි. ඒවා නම්,

1. ....
2. ....
3. ....
4. ....

48). දිගුකාලීන ආයෝජන තීරණ (ප්‍රාග්ධන ආයෝජන තීරණ) සඳහා උදාහරණ හතරක් දක්වන්න.

1. ....
2. ....
3. ....
4. ....

49). ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතියේ සංයුතිය පහත සටහන මගින් දක්වා ඇත.



ඉහත 1,2,3 හා 4 ස්ථානවලට අයත් අංක නම් කරන්න.

1. ……………………………………………………………………
2. ……………………………………………………………………
3. ……………………………………………………………………
4. ……………………………………………………………………

50). මානව සම්පත් අවශ්‍යතාව/ ඉල්ලුම පුරෝකතනයේදී ,අවධානය යොමු කළ යුතු සාධක වනුයේ,

1. ……………………………………………………………………
2. ……………………………………………………………………
3. ……………………………………………………………………
4. ……………………………………………………………………

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

13 ශ්‍රේණිය - අවසාන වාර පරීක්ෂණය

ව්‍යාපාර අධ්‍යයනය -1 පත්‍රය පිළිතුරු

ප්‍රශ්න අංකය	පිළිතුර	ප්‍රශ්න අංකය	පිළිතුර	ප්‍රශ්න අංකය	පිළිතුර
1	**2**	11	**2**	21	**1**
2	**4**	12	**4**	22	**4**
3	**5**	13	**3**	23	**3**
4	**1**	14	**5**	24	**4**
5	**3**	15	**2**	25	**4**
6	**2**	16	**1**	26	**1**
7	**4**	17	**3**	27	**2**
8	**3**	18	**3**	28	**5**
9	**5**	19	**2**	29	**3**
10	**1**	20	**4**	30	**1**

(2×30=60)

31) (අ) තත්ත්වයක් , අවශ්‍යතා හා වුවමනා

(ආ) සම්පත් පරිභෝජනය , ජීවන තත්ත්වය උසස් කිරීම

32) (අ) කොටස් නිකුත් කිරීම, ලාභ බෙදා හැරීම

(ආ) විදේශ සමාගම් ,අක්වෙරළ සමාගම්

33) (අ) කාර්මික සංවර්ධන මණ්ඩලය,ශ්‍රී ලංකා සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත මණ්ඩලය(SLCSMI)

(ආ) නායකත්ව, අන්තර් පුද්ගල හැකියා

34) (අ) සේවක අර්ථසාධක අරමුදල, කම්කරු කොමසාරිස්වරයා

(ආ) රක්ෂණ යෝජනා පත්‍රය, ලිඛිත එකඟතාවය

35) (අ) ස්වයංක්‍රීය ඇසුරුම් ක්‍රමය , එහා මෙහා කළ හැකි තට්ටු සහිත රාමු

(ආ) ආනයන හා අපනයන පාලක දෙපාර්තමේන්තුව, ආනයන හා අපනයන පාලක

36) (අ) සංවිධාන ව්‍යුහය , පාලන අවකාශය, පාලන විතස්තිය/ කළමනාකරන අවකාශය

(ආ)අණකිරීමේ දාමය, අණකිරීමේ ඒකීයතාවය

37) (අ) මනෝවිද්‍යාත්මක, චර්යාත්මක

(ආ) මූලික ගුණාංග , ප්‍රයෝජ්‍යතාවය

38) (අ) සේවක අවශ්‍යතා, උපාය මාර්ග

(ආ) උපකාරී වන්නා වූ හැකියා,ධනාත්මක සංකල්ප වලින් යුත්

39) (අ) ද්‍රවශීලතා, ක්‍රියාකාරී

(ආ) ගෙවීම්, පියවීම්

40) (අ)ගණනය කිරීම,සාරාංශ කරණය

(ආ)සාර්ව විශ්ලේෂණය, සූක්ෂම විශ්ලේෂණය

41)

1. ස්වේච්චාවෙන්
2. SLS සහතික ලාංඡන ක්‍රමය
3. පූර්ව අපනයන පරීක්ෂාව
4. ආනයන පරීක්ෂාව
5. අපනයන සඳහා පිළියෙල කර මුහුදු ආහාර පරීක්ෂාව මගින්

42)

1. ව්‍යාපාරයේ ස්වභාවය
2. වගකීමේ ස්වභාවය
3. ව්‍යාපාරයේ පැවැත්ම පිළිබඳ
4. අවශ්‍ය ප්‍රාග්ධන ප්‍රමාණය හා සම්පාදනය

43)

1. රාජ්‍ය ණය කළමනාකරණය
2. විදේශ විනිමය පාලනය
3. සේවක අර්ථසාධක අරමුදල කළමනාකරණය
4. කුඩා පරිමාණ මූල්‍යකරන වැඩසටහන් සඳහා ග්‍රාමීය ණය යෝජනා ක්‍රම පිළිබඳ මූලික ආයතනය ලෙස කටයුතු කිරීම

44)

1. නිෂ්පාදිතවල ගුණත්වය ආරක්ෂා කර ගත හැකි වීම
2. නිෂ්පාදිත අඛණ්ඩව වෙළඳපොළට සැපයීම මගින් පාරිභෝගික විශ්වාසය දිනා ගැනීම
3. අපතය අවම වීම තුළින් පිරිවැය අවම කර ගත හැකිවීම
4. අපද්‍රව්‍ය කළමනාකරණය නිසි පරිදි සිදුවීමෙන් ගැටළු මතු නොවීම
5. තරගකාරීත්වයට සාර්ථකව මුහුණ දිය හැකිවීම
6. යන්ත්‍ර සූත්‍ර සේවකයන් වෙනුවෙන් දරන අක්‍රිය පිරිවැය අවම කරගත හැකිවීම

45)

1. කොමිස් නියෝජිතය
2. කැපකරු නියෝජිතයා
3. සාධ්‍යකයා
4. තැරුව්කරු /කර්වරයා

46)

1. තොග පවත්වාගෙන යාමේ පිරිවැය
2. ආර්ථික ඇනවුම් ප්‍රමාණය
3. මුළු පිරිවැය
4. ඇණවුම් කිරීමේ පිරිවැය

47)

1. පාරිභෝගික අවශ්‍යතා හා වුවමනා
2. පිරිවැය
3. පහසුව
4. සන්නිවේදනය

48)

1. ව්‍යාපාරය ස්තාපනය කිරීම
2. ව්‍යාපාරය නවීකරණය කිරීම හා පුළුල් කිරීම
3. ව්‍යාපාරය විවිධාංගිකරණය කිරීම
4. ස්ථාවර වත්කම්/ දිගු කාලීන සුරැකුම් පත්

49)

1. මධ්‍යම බැංකුව
2. මූල්‍ය උපකරණ
3. මූල්‍ය යටිතල පහසුකම්
4. අනෙකුත් නියාමන ආයතන

50)

1. භාණ්ඩය හෝ සේවාව සඳහා වූ ඉල්ලුම
2. ආයතනයේ පරමාර්ථය
3. නිෂ්පාදන ක්‍රමය
4. අනාගත සේවක විශ්‍රාම යෑම්, ඉල්ලා අස්වීම්, උසස්වීම්, ඉවත් කිරීම්, සේවා නියුක්තිය අවසන් කිරීම්
5. ආයතනයේ වර්තමාන හා අනාගත මූල්‍ය තත්ත්වය
6. ආර්ථික, සමාජයීය, දේශපාලන හා නෛතික පරිසරය

(2×10=20)

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
13 ශ්‍රේණිය අවසාන වාර පරීක්ෂණය - පිළිතුරු පත්‍රය
II- පත්‍රය
ව්‍යාපාර අධ්‍යයනය - 2024

01.

I. (අ) මිනිස් අවශ්‍යතා ඉටු කිරීම- රූපලාවන්‍ය නිෂ්පාදන සැපයීම.
සම්පත්වලට අගයක් එකතු කිරීම - දේශීය අමුද්‍රව්‍ය රූපලාවණ්‍ය නිෂ්පාදන බවට පත් කිරීම. (ල.02)

(ආ)

- භූමිය- ව්‍යාපාර ආයතනය
- ශ්‍රමය- පියුමි,රුවනිගේ ශ්‍රමය
- ප්‍රාග්ධනය - අමුද්‍රව්‍ය
- ව්‍යවසායකත්වය- රූපලාවන්‍ය නිෂ්පාදන සැකසීම
- කාලය- වැඩ කරන කාලය
- තොරතුරු- වෙළඳපොල තොරතුරු
- දැනුම- වෙළඳපොළ පිළිබඳ දැනුම (ල.02)

II. (අ) වාණිජ්‍ය - නිෂ්පාදන බෙදා හැරීම.
කර්මාන්ත - රූපලාවන්‍ය නිෂ්පාදන සැකසීම. (ල.02)

(ආ) ආසන්න පරිසර සාධක; සැපයුම්කරුවන්, ගනුදෙනුකරුවන්
සාර්ව පරිසර සාධක ; ආර්ථික පරිසරය ,ගෝලීය පරිසරය, ස්වභාවික පරිසරය
විදේශීය ගැනුම්කරුවන් රූපලාවණ්‍ය නිෂ්පාදන මිලට ගැනීම ආසන්න පරිසරයට අයත් වන අතර , ඒවා ගෝලීය වෙළඳපොළ තුළ අලෙවි වීම, සාර්ව පරිසර බලවේගයක් වූ ගෝලීය පරිසරයට අයත් වේ.
අමුද්‍රව්‍ය සැපයුම් කරුවන් ආසන්න පරිසරයට අයත් වන අතර, ඒවා ස්වභාවික පරිසරයට අයත් වීම සාර්ව පරිසරයට අයත් වේ. (ල.02)

III. (අ)

- ආර්ථික වර්ධනය හා සංවර්ධනය ඇතිවීම
- දේශීය සම්පත් උපයෝජනය ඉහළයාම.
- විදේශ විනිමය ඉපයීමට දායක වීම
- රැකියා අවස්ථා ඇතිවීම
- ජීවන තත්ත්වය උසස් වීම (ල.02)

(ආ)

- ලියාපදිංචියට යොමුවීම
- කීර්ති නාමය වර්ධනය වීම.
- රජයේ හා මහජනතාවගේ පිළිගැනීම ඇතිවීම.
- ආර්ථික වර්ධනයට හා සංවර්ධනයට දායකවීම. (ල.02)

IV. (අ)
2007 අංක 07 දරණ සමාගම් පනත, සාප්පු හා කාර්යාල සේවක පණත, විලවුන් හා ඖෂධ පනත, 2003 අංක 9 දරණ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පණත (ල.02)

(ආ)

ගනුදෙනුකරුවන්ට	සමාජයට
• භානි අවම කිරීම • අයිතිවාසිකම් ආරක්ෂා කිරීම • සාධාරණ වීම	• හරිත නිෂ්පාදන බිහිකිරීම • ප්‍රජා සත්කාරක සේවා සිදුකිරීම • රැකියා නිර්මාණය • පරිසර දූෂණය අවම කිරීම

(ල.02)

V. (අ) ආනයනික වෙළෙඳුන්- වෙළඳාම බිඳ වැටීම
ආනයනික අමුද්‍රව්‍ය භාවිතා කර භාණ්ඩ නිපදවන්නන්-නිෂ්පාදන මිහල ඉහළ යාමෙන් භාණ්ඩ මිල ඉහළ යාමෙන් අලෙවිය අඩුවීම.
දේශීය අමුද්‍රව්‍ය නිපදවන්නන් - දේශීය අමුද්‍රව්‍ය ඉල්ලුම ඉහළ යාම.
පාරිභෝගිකයින්- ගුණත්වයෙන් යුතු නිෂ්පාදිත තෝරාගැනීමට අපහසුවීම. (ල.02)

(ආ)

බැංකු පොලී අනුපාතිකය පහත හෙලූ විට ව්‍යාපාරිකයින් ණය ලබා ගැනීමට පෙළඹෙන අතර ින් ව්‍යාපාර කටයුතු පුළුල්වේ.

(ල.02)

02.

I. (අ)

- භාණ්ඩ හා සේවා බහුලවීම
- ගෝලීයකරණය
- මිනිස් අවශ්‍යතා හා වුවමනා සංකීර්ණ වීම
- භාණ්ඩ හා සේවා බහුලවීම
- මිනිස් සිතුම් පැතුම් වෙනස්වීම

(ල.02)

(ආ)

- වැරදි කිරුම් මිනුම් උපකරණ භාවිතා කිරීම
- ගුණත්වයෙන් අඩු නිෂ්පාදන ලබාදීම
- භාණ්ඩ හිඟයක් මැවීම
- අසත්‍ය දෑ ප්‍රචාරණය කිරීම
- පරිසර දූෂණය
- සංස්කෘතියට නොගැලපෙන නිෂ්පාදන අලෙවි කිරීම
- ගුණත්වයෙන් අඩු දෑ අපනයනය කිරීම (ල.02)

II. (අ)

- ස්වේච්ඡාවෙන්
- SLS සහතික ලාංඡන ක්‍රම මගින්
- පූර්ව අපනයන පරීක්ෂාව මගින්
- ආනයන පරීක්ෂාව මගින්
- අපනයනය පිළිබඳව පිළියෙළ කළ මුහුදු ආහාර පරීක්ෂාව මගින් (ල.02)

(ආ)

- තරගකාරීත්වයට මුහුණ දිය හැකිවීම
- අනෙකුත් නිෂ්පාදන අභිබවා වාසි ලැබිය හැකිවීම
- පාරිභෝගික පැමිණිලි අවම වීම
- වෙළඳපොළ කොටස පුළුල් කරගත හැකිවීම
- නාස්තිය අවම වී ඵලදායිතාවය වර්ධනය වීම
- ආයතනයේ ප්‍රතිරූපය ඉහළ යාම
- ISO ලබා ගැනීම තුළින් විදේශ වෙළඳාම සාර්ථක වීම (ල.02)

III. (අ) කේවල ස්වාමී ව්‍යාපාර , හවුල් ව්‍යාපාර (ල.02)

(ආ) සමානකම්

- අඛණ්ඩ පැවැත්මක් නොමැතිවීම
- වගකීම අසීමිත වීම
- නෛතික පුද්ගලභ භාවයක් නොමැතිවීම
- ලියාපදිංචිය අනිවාර්ය නොවීම
- ගිණුම් තැබීම අනිවාර්ය නොවීම

අසමානකම්

කේවල ස්වාමී ව්‍යාපාර	හවුල් ව්‍යාපාර
• තනිව ප්‍රාග්ධනය යොදයි • අයිතිකරුවන් සංඛ්‍යාව එකයි	• හවුලේ ප්‍රාග්ධනය යොදයි • 2-20

• ලාභය තනිවම භුක්ති විඳි • තනිව තීරණ ගනියි	• හවුල්කරුවන් පරිපාලනය කරයි • හවුලේ ලාභය භුක්ති විඳී • හවුලේ තීරණ ගනියි

(ල.02)

IV. (අ) සමාගම් දෙකක් හෝ කිහිපයක් එකට එකතු වී ව්‍යාපාර කටයුතු කිරීම. (ල.02)

(ආ)

තිරස් සංයෝජනය යනු එක සමාන ව්‍යාපාර කටයුතුවල යෙදී සිටින සමාගම් දෙකක් හෝ කිහිපයක් ඒකාබද්ධ වීමයි උදා; වාණිජ බැංකුවක් තවත් බැංකුවක් සමඟ එක්ව කටයුතු කිරීමයි

සිරස් සංයෝජනය යනු කිසියම් නිෂ්පාදිතයක විවිධ අවස්ථාවල යෙදී සිටින සමාගම් කිහිපයක් ඒකාබද්ධ වීමයි. උදා; ඇඟලුම් නිෂ්පාදන සමාගමක් ඇඟලුම් අලෙවිසැලක් මිලට ගැනීම (ල.02)

V. (අ)

- රාජ්‍ය සංස්ථා
- රාජ්‍ය දෙපාර්තුමේන්තු
- රාජ්‍ය සමාගම්
- පළාත් පාලන ආයතන යටතේ පවතින ව්‍යාපාර (ල.02)

(ආ)

- කොටස් නිකුත් කර ප්‍රාග්ධනය එක් රැස් කර ගැනීමට හැකිවීම
- වගකීම සීමිත වීම
- දක්ෂ අධ්‍යක්ෂක හා කළමනාකරුවන් බඳවා ගැනීමට හැකිවීම
- ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි බල නොපෑම.
- රාජ්‍ය මැදිහත්වීම අවම වීම (ල.02)

03.

I. (අ)

- අවදානම් දැරීමට ඇති කැමැත්ත
- නිර්මාණශීලී බව
- කැපවීම
- ආත්ම විශ්වාසය
- ස්වාධීන බව
- නායකත්වය
- අන්තර් පුද්ගල හැකියාව
- සන්නිවේදන කුසලතාවය
- මූලික කළමනාකරණ කුසලතාවය (ල.02)

(ආ)

- අමුද්‍රව්‍ය හිඟය
- මූල්‍ය සම්පත් හිඟය
- තරගකාරීත්වය
- යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවීම
- නව තාක්ෂණය යොදා ගැනීමේ අපහසුව
- වෙළඳ පොළ ගැටලු (ල.02)

II. (අ)

මූල්‍ය දිරිගැන්වීම් - කෙටිකාලීන හා දිගු කාලීන ණය , මූල්‍යමය ආධාර, බදු සහන, ප්‍රතිමූල්‍ය පහසුකම්

මූල්‍යමය නොවන දිරිගැන්වීම්- උපදේශන සේවා , සංවර්ධන වැඩසටහන්, යටිතල පහසුකම්, පර්යේෂණ හා තාක්ෂණික සේවා, අලෙවි පහසුකම්, සම්මාන ලබාදීම (ල.02)

(ආ)

- පෞද්ගලික මූල්‍යමය ලාභ
- සමාජ තත්ත්වය හා පිළිගැනීම
- ඉහළ ප්‍රතිලාභ
- ආත්ම තෘප්තිය
- තම හැකියාවලින් ප්‍රයෝජන ගත හැකිවීම (ල.02)

III.

- නව වෙළඳපොළවල් බිහිවීම
- ජාතික නිෂ්පාදිතය ඉහළයාම
- නව රැකියා ඇතිවීම
- ප්‍රාදේශීය සම්පත් භාවිතය ඉහළ යාම
- ආදායම් මට්ටම ඉහළ යාම

(සාධක ඇතුළත් පැහැදිලි පිළිතුරකට ලකුණු හතරයි)

IV. (අ)

මහ බැංකුව	බලපත්‍ර ලාභී වාණිජ බැංකුව
• මුදල් පනත යටතේ පිහිටුවයි • මුදල් මුද්‍රණය කරයි • රජයේ බැංකුවේ	• බැංකු පනත යටතේ පිහිටුවයි • මුදල් මවයි • මහජනතාවගේ හා ව්‍යාපාරවල බැංකුව වේ

(ල.02)

(ආ)

- ආයිරා පහසුකම් හිමිවීම
- චෙක් පත්වලින් ගනුදෙනු කළ හැකිවීම
- ඍජු ප්‍රේෂණ
- ස්ථාවර නියෝග ක්‍රියාත්මක කිරීම
- බැංකු ප්‍රකාශන ලබා ගැනීමට හැකිවීම

(ල.02)

V. (අ)

නව ව්‍යවසායකයින් ගේ ව්‍යාපාර සඳහා ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීමේ අරමුණින් කටයුතු කරන කොටස් ප්‍රාරක්ෂණය හා ණය සම්මේලනය යෙදෙන ආයතනයයි (ල.02)

(ආ)

- ආයෝජකයින් ගේ කොටස් ගැනුම් ඇනවුම් හා විකුණුම් ඇනවුම් භාර ගැනීම
- මධ්‍යම තැන්පතු ගිණුම් විවෘත කිරීම
- ආයෝජකයින්ට උපදෙස් සැපයීම
- වෙළඳපොළ සමීක්ෂණ වාර්තා සැකසීම
- සමාගම් ලැයිස්තුගත කිරීමට අනුග්‍රහය දැක්වීම
- පොදු සමාගම්වලට ප්‍රාග්ධනය සැපයීමට සම්බන්ධ පහසුකම් සැපයීම (ල.02)

04.

I. (අ)

- වෙළෙඳ ගනුදෙනුවලදී අදාළ පාර්ශ්ව සමග අදහස් හුවමාරු කර ගැනීම
- සේව්‍ය සේවක සම්බන්ධතා පවත්වා ගැනීම
- මානව හා භෞතික සම්පත් මනාව පාලනය කිරීම
- අලෙවි ප්‍රවර්ධන කටයුතු සඳහා (ල.02)

(ආ)

වාසි

- වඩාත් විස්තරාත්මකව තොරතුරු ඉදිරිපත් කළ හැකි වීම
- තොරතුරු සන්නිවේදනය කළ බවටත් ලැබුණු බවටත් සාක්ෂියක් ලෙස භාවිතා කළ හැකි වීම
- දත්ත සටහන් වගු යනාදිය පහසුවෙන් සන්නිවේදන කළ හැකිවීම

අවාසි

- තොරතුරු අවබෝධ කර ගැනීමේ දී ගැටලු ඇතිවීම
- කියවීමේ හැකියාව නොමැති නම් තොරතුරු සන්නිවේදනය කිරීම අපහසු වීම
- තොරතුරු සන්නිවේදන කිරීමේදී විකෘති වීම (ල.02)

II. (අ)

- ගොඩනැගිල්ලේ පිරියත සැලැස්ම(Layout) හා ගොඩනැගිල්ල තුලින් චලනය කිරීමේ හැකියාව
- ද්‍රව්‍ය භාවිතය වේගවත් බව හා ගබඩාව තුළ කලාප වෙන් කිරීමේ අවශ්‍යතාවය
- ද්‍රව්‍ය එහා මෙහා කිරීමේ හැකියාව
- ප්‍රධාන සම්බන්ධතාවයට ආසන්න බව
- ගබඩා කරන ද්‍රව්‍යවල ස්වභාවය (ල.02)

(ආ)

- ගබඩා කුලිය
- ඇප තැන්පතු
- රක්ෂණ ගාස්තු
- වාහන නවතා තැබීමේ සම්බන්ධ වියදම් (ල.02)

III. (අ)

වාසි

- බෙදා හැරීම් පහසුවීම
- වෙළෙඳපොළ තුළ භාණ්ඩ හිඟයක් ඇති නොවීම
- වෙළෙඳපොළ තොරතුරු ලබාගත හැකි වීම
- බෙදා හැරීම කාර්යක්ෂම වීම
- නව භාණ්ඩ හඳුන්වාදීමට පහසුවීම

අවාසි

- භාණ්ඩ මිල ගණන් ඉහළ යාම
- අනවශ්‍ය භාණ්ඩ හිඟයක් ඇතිවීම (ල.02)

(ආ)

- වෙළෙඳපොළ තොරතුරු ලබාගැනීමට හැකිවීම
- භාණ්ඩ තොග වශයෙන් වෙළඳපොළට සැපයීම
- සිල්ලර වෙළෙන්දාට පහසුකම් සැපයීම
- භාණ්ඩ තේරීම, ඇසිරීම, මිශ්‍ර කිරීම සිදුකිරීම (ල.02)

IV.

- වෙළෙඳ ගිවිසුම් ඇති වීම
- වෙළඳ කලාප ඇතිවීම
- පොදු මුදල් ඒකක භාවිතා කිරීම
- වෙළෙඳ සංගම් බිහිවීම
- ලෝක සංවිධාන බිහිවීම (ල.02)

V. (අ)

- කීර්ති නාමය ඉහළයාම
- ලාභය වැඩිවීම

- පිරිවැය වාසි ඇතිවීම
- පුළුල් වෙළඳ පොළලක් ඇතිවීම (ල.02)

(ආ)

- අන්තර්ජාල පහසුකම් සෑම ප්‍රදේශවලම ව්‍යාප්ත නොවීම
- ගෙවීම් ක්‍රමව වල ගැටලු
- පාරිභෝගික දැනුම මදිකම
- විද්‍යුත් ක්‍රමවල විශ්වාසය නොමැතිකම
- වංචා දූෂණ සිදුවීම
- බදු අය කිරීම් වැනි ගැටලු (ල.02)

05.

I. (අ)

මානව කුසලතා

- අන් අය අවබෝධ කර ගැනීම
- ඔවුන් සමඟ සහයෝගයෙන් වැඩ කිරීමට
- ඔවුන් ලවා වැඩ කරවා ගැනීමට
- සෑම කෙනෙකුටම මානුෂිකව සැලකීමට හැකිවීම (ල.02)

(ආ)

සෑම මට්ටමකම කළමනාකරුවන්ට පුද්ගලයින් හා කණ්ඩායම් සමඟ කටයුතු කිරීමට සිදුවන නිසා මානව කුසලතා සෑම කළමනාකරුවකුටම එක සමානව වැදගත් වේ (ල.02)

II. (අ)

- කළමනාකරුවන් අනෙකුත් කළමනාකරුවන් හා සේවකයින් අවබෝධ කරගෙන සහයෝගයෙන් වැඩ කිරීම
- ආයතනයේ සේවකයින් තෘප්තිමත් වීම නිසා උනන්දුවෙන් හා කැපවීමෙන් වැඩ කිරීම (ල.02)

(ආ)

1. මූල්‍ය අභිප්‍රේරණ ක්‍රම
2. මූල්‍ය නොවන අභිප්‍රේරණ ක්‍රම

මූල්‍ය නොවන අභිප්‍රේරණ ක්‍රම

- යෝග්‍ය වැඩ පරිසරයක් ඇතිකිරීම
- සේවකයින් සවිබල ගැන්වීම
- සේවකයින් ඇගයීම
- රැකියා සුරක්ෂිත බව ඇති කිරීම (ල.02)

III.

1. අග්‍ර කළමනාකරුවන්
2. මධ්‍ය කළමනාකරුවන්
3. පළමු පෙළ කළමනාකරුවන් (ලකුණු ½)





(ලකුණු ½)

- සෑම මට්ටමකම කළමනාකරුවන්ට එක සමානව මානව කුසලතා තිබිය යුතුය (ල.01)
- පළමු පෙළ කළමනාකරුවන්ට තාක්ෂණික කුසලතා වැඩිපුර අවශ්‍ය වේ. (ල.01)
- අග්‍ර කළමනාකරුවන්ට සංකල්පනාත්මක කුසලතා වැඩිපුර අවශ්‍ය වේ (ල.01)

IV.

(අ) 1. තොග ඇනවුම් කිරීමේ පිරිවැය
2. තොග පවත්වාගෙන යාමේ පිරිවැය

(ලකුණු 1)

1. තොග ඇනවුම් කිරීමේ පිරිවැය

තොග ගැනුම් මිල, ඇනවුම් පිළියෙළ කිරීමේ වියදම්, ද්‍රව්‍ය පරීක්ෂා කිරීමේ වියදම්, ද්‍රව්‍ය ගෙන ඒමේ වියදම් මෙයට ඇතුළත් වෙයි

2. තොග පවත්වාගෙන යාමේ පිරිවැය

ගබඩාවට තොග ලැබූ අවස්ථාවේ සිට ගබඩාවෙන් තොග නිකුත්කිරීම තෙක් සියලු වියදම් මෙයට අයත් වේ ගබඩා වියදම්, ගබඩා විදුලි ගාස්තු, ද්‍රව්‍ය එහා මෙහා කිරීමේ වියදම්, ගබඩා මුරකරුගේ වේතන, රක්ෂණ ගාස්තු

(ලකුණු 1)

(ආ)

$$EOQ = \sqrt{\frac{2DCO}{Ch}}$$
$$= \sqrt{\frac{2\times100000\times50}{100}}$$
$$= \sqrt{\frac{1000000}{100}}$$
$$= 100$$

(ල.2)

EOQ= ආර්ථිකය ඇණවුම් ප්‍රමාණය

CO= එක් ඇනවුමක් සඳහා පිරිවැය

D= වාර්ෂික තොග අවශ්‍යතාව /වාර්ෂික ඉල්ලුම

Ch= එක් ඒකකයක් කාලච්ඡේදයක් තුළින් පවත්වාගෙන යාමේ පිරිවැය

V. (අ)

1. නිෂ්පාදන පිරිවිතර
2. ද්‍රව්‍යවල ගුණත්වය
3. ද්‍රව්‍යවල මිල
4. සැපයීමේ වේගවත් බව හා අඛණ්ඩව ලබාගත හැකි බව
5. සැපයුම් කරුවන්ගේ විශ්වාසවන්ත භාවය
6. පොරොත්තු කාලය
7. ගෙවීම් කොන්දේසි (ලකුණු1/2×4)

(ආ)

- නියමිත ගුණත්වයෙන් යුතුව භාණ්ඩ සැපයීමට හැකිවීම.
- හානි වීම් හා පලුදු වීම් අඩු නිසා අපතේ යාම අඩුවීම
- තරඟකාරීත්වයට සාර්ථකව මුහුණ දීමට හැකිවීම හා අඛණ්ඩව වෙළෙඳපොළ තුළ රැඳී සිටීමට හැකිවීම
- නෛතික තත්ත්වයන් අනුව කටයුතු කළ හැකිවීම /ආයතනයේ සමස්ත පිරිවැය අඩුවීම

(ලකුණු 2)

06.

I. (අ) 1.

යම්කිසි විකුණුම්කරුවකුගේ නිෂ්පාදිත තරගකාරී නිෂ්පාදිතවලින් වෙන් කොට හඳුනාගැනීම සඳහා භාවිතා කළ හැකි නමක්,වචනයක්, සංකේතයක් ,සළකුණක්, මෝස්තරයක් නැතහොත් ඒවායේ සංයෝග සන්නමක් (Brand) ලෙස හැඳින්වෙයි.

(ලකුණු 1)

2.

- කෙටි හා සරලව වීම
- උච්චාරණය හඳුනාගැනීමම හා මතක තබා ගැනීම පහසුවීම
- නිෂ්පාදනයෙහි මූලික ගුණාංග ප්‍රයෝජ්‍යතාවය පිළිබඳ අදහසක් පැවතීම
- පහසුවෙන් වෙනත් භාෂාවකින් හැඳින්විය හැකිවීම
- තරගකරුවන්ගේ සන්නාම වලට වඩා වෙනස් වීම

(ල1/2×1)

(ආ)

1. ඇනවුම් ලබාග ගැනීම පහසුවීම
2. නීතිමය ආරක්ෂාවක් ලැබීම
3. භාණ්ඩයේ විශේෂ ගුණත්වයන් පිළිබඳව පාරිභෝගික විශ්වාසය තහවුරුකර ගැනීම
4. පාරිභෝගිකයින් අතර සන්නාම පක්ෂපාතීත්වය ඇති කරගත හැකිවීම
5. සන්නමට ව්‍යාපාරයේ වටිනාකමක් හිමිවීම නිසා ව්‍යාපාරයට වටිනාකමක් ලැබීම
6. අනෙකුත් තරගකාරී සන්නාම වලින් හෝ තම ආයතනයේ සන්නම වෙන් කොට හඳුනාගත හැකිවීම

(4×1/2)

II. (අ) 1. ඇසුරුමක මූලික කාර්ය භාණ්ඩයකට ආරක්ෂාව ලබාදීමයි (ල.1)

2.

- ප්‍රාථමික ඇසුරුම
- ද්විතීක ඇසුරුම
- ප්‍රවාහන ඇසුරුම

(ල.1)

(ආ)

- නිෂ්පාදිතයේ ස්වභාවය
- ඇසුරුමෙන් නිෂ්පාදිතයට ලැබෙන ප්‍රයෝජන
- තාක්ෂණික යෝග්‍යතාව
- ඇසුරුමක තිබිය යුතු අංග
- වෙළෙන්දාට ඇති පහසුව
- පාරිභෝගිකයාට ඇති පහසුව හා ප්‍රයෝජන
- පරිසර හිතකාමී බව
- ඇසුරුම සඳහා වැයවන පිරිවැය

(1/2×4)

III. (අ)

ව්‍යාපාර ආයතනයක අලෙවිය වර්ධනය කර ගැනීම සඳහා ප්‍රවර්ධනයට අදාළ සාධක හෙවත් උපකරණ මනාව සංකලනය කරමින් අලෙවි ප්‍රයත්නය සාර්ථක කර ගැනීමේ කාර්යභාරය ප්‍රවර්ධන මිශ්‍රය ලෙස හඳුන්වයි

(ල.2)

(ආ)

ආයතනයක අනුග්‍රාහය සහිතව ව්‍යාපාර දිනපතා හෝ විශේෂ අවස්ථාවල හෝ සංවිධානාත්මකව කරනු ලබන අන්තර් ක්‍රියාකාරී කටයුතු වැඩසටහන් ඉසව් හා අත්දැකීම් වේ. මෙහිදී ගනුදෙනුකරුවන් සක්‍රීයව සහභාගි වීමක් සිදුවෙයි

(ල.2)

IV. 1. භාණ්ඩ බෙදා හැරීමේ මාර්ග → පාරිභෝගික භාණ්ඩ බෙදාහැරීම / කාර්මික භාණ්ඩ බෙදා හැරීම

2. සේවා බෙදා හැරීමේ මාර්ග

(ල.2)

- තරඟකරුවන්ගේ ස්වභාවය
- භාණ්ඩයේ ස්වභාවය
- ඉල්ලුමේ ස්වභාවය

(ල.2)

V. (අ)

- සම්පත් වෙළඳපොල
- නිෂ්පාදිත වෙළඳ පොළ
- රජයේ වෙළෙඳපොල
- අතරමැදියන්ගේ වෙළෙඳපොල (ල.2)

(ආ)

1. පාරිභෝගික වුවමනා ප්‍රශස්ත මට්ටමින් ඉටුවන අයුරින් නිෂ්පාදිතයන් වෙළඳ පොළට ඉදිරිපත් කිරීමට හැකිවීමෙන් පිරිවැටුම වැඩිකර ගැනීමට හැකිවීම
2. නිෂ්පාදිතයට තරගකාරීත්වයට මුහුණ දිය හැකි ආකාරයෙන් මිලක් නියම කිරීමෙන් පාරිභෝගිකයා ආකර්ෂණය කරගත හැකිවීම
3. විවිධ ප්‍රවර්ධන උපක්‍රම භාවිතා කරමින් භාණ්ඩ මිලදී ගැනීමට පොළඹවා ගැනීමට හැකිවීම
4. සමස්තයක් ලෙසට ආයතනයේ අරමුණු ඉටුකර ගැනීමට අලෙවිකරණ මිශ්‍රයේ සියලු විචල්‍ය උපකාර වෙයි

(ල.2)

07.

I. (අ)

- සේවක ඵලදායිතාවය වර්ධනය කිරීම
- සේවක කැපවීම නංවාලීම
- සේවක සංවර්ධනය ඇති කිරීම
- සේවක අභිප්‍රේරණය කිරීම
- සේවක සුභසාධනය
- සේවකයින් අවශ්‍ය පරිදි බඳවා ගැනීම
- යෝග්‍යම සේවකයින් ආයතනයේ රඳවා ගැනීම
- යහපත් කාර්මික සම්බන්ධතා පවත්වාගෙන යාම
- සේවා නියුක්ති පිරිවැය පාලනයට
- සේවක නෛතික හා සමාජීය වගකීම් ඉටුකි කිරීමට (ල.2)

(ආ)

- සේවක ඵලදායිතාවය ඉහළ යාම
- සම්පත් නාස්තිය අඩුවීම
- සේවක ප්‍රවාසීතාවය අඩුවීම
- සේවක පිරිවැටුම අඩුවීම
- අභිප්‍රේරණය වූ සේවක කණ්ඩායමක් බිහිවීම
- කාර්මික ආරවුල් අඩුවීම (ල.2)

II. (අ)

- දැනුම

- කුසලතා
- ආකල්ප
- යහපත් ශාරීරික මානසික යෝග්‍යතාව (ල.2)

(ආ)

1. බඳවා ගැනීම
2. අනුස්ථාපනය
3. කාර්ය ඵල මැනීම
4. සංවේතන කළමනාකරණය
5. පුහුණුව හා සංවර්ධනය
6. දුක් ගැනවිලි කළමනාකරණය
7. ණය විනය කළමනාකරණය
8. සේවක සෞඛ්‍ය හා ආරක්ෂාව
9. යහපත් කාර්මික සම්බන්ධතා (ල.2)

III. (අ)

- සේවක දැනුම කුසලතා ආකල්ප යහපත් වීම
- සේවක කාර්ය සාධනය වර්ධනය වීම
- නිමැවුමේ ගුණත්වය ඉහළ යාම
- සේවක අභිප්‍රේරණය ඇති වීම
- සේවක පක්ෂපාතීත්වය ඇතිවීම
- සේවකයින් විසින් සිදුවන වැරැදි නාස්ති අඩුවීම
- සේවක ප්‍රවාසිතාවය අඩුවීම
- සේවක පිරිවැටුම අඩුවීම (ල.2)

(ආ)

කිසියම් රැකියාවක් වඩාත් නිවැරදිව කිරීමට සේවකයින් තුළ ආත්ම විශ්වාසයක් ඇති කර වර්තමාන කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම පුහුණුව තුළින් සිදුවන අතර, සේවකයාගේ අනාගත ක්‍රියාකාරීත්වය ඉහල නැංවීම සංවර්ධනයෙන් සිදුවේ. එබැවින් කළමනාකරුවන්ට එය අවශ්‍ය වේ

පුහුණුව	සංවර්ධනය
• කෙටිකාලීනයි • වර්තමාන ක්‍රියාකාරීත්වයට සේවකයා සූදානම් කරයි • පටු වැඩ පිළිවලකි	• දිගුකාලීනයි • අනාගත ක්‍රියාකාරීත්වයට සේවකයා සූදානම් කරයි • පුළුල් වැඩපිළිවෙලකි

(ල.2)

IV. (අ)

- සේවක වගකීම් නිසි පරිදි ඉටු කිරීම
- ආයතනයේ වර්ධනයට උනන්දු වීම
- ආයතනයේ රහස් බාහිර පාර්ශ්වවලට අත් කර නොදීම
- ආයතනයේ කීර්ති නාමය වර්ධනයට දායක වීම

(ල.2)

(ආ)

- සමාජ ප්‍රශ්න වර්ධනය වීම
- ජන ජීවිතය අඩාල වීම
- වෙළෙඳපොළ භාණ්ඩ හිඟය
- භාණ්ඩ හා සේවා මිල ඉහළ යාම
- භාණ්ඩවල ගුණත්වය පහළ යාම

(ල.2)

V. (අ)

ව්‍යාපාරයක තීරණ ගැනීම හා පාලනය සඳහා අවශ්‍ය තොරතුරු රැස්කිරීම, සැකසීම, ගබඩා කිරීම හා බෙදාහැරීම සඳහා වූ අන්තර් සම්බන්ධතාවයෙන් යුත් උපාංග සමූහයයි. (ල.2)

(ආ)

- අදාළ පාර්ශවයන්ට නිවැරදිව තොරතුරු සන්නිවේදනය කිරීම
- ආයතනයේ පිරිවැය අවම වීමට
- තරගකාරීත්වයට මුහුණ දීමට
- කළමනාකරණ කාර්යයන්හි සාර්ථකත්වයට
- අවශ්‍ය ඕනෑම අවස්ථාවක අදාළ පාර්ශ්වයන්ට තොරතුරු සැපයීමට

(කරුණු හතරට 1/2 බැගින් ලකුණු 02යි)

08.

I. (අ)

1. වර්ගීකරණය- දත්ත ඒවාගේ ලක්ෂණ අනුව කොටස් වලට වෙන්කිරීම
2. තේරීම - දත්ත සුවිශේෂී පිළිවෙලකට සැකසීමයි
3. ගණනය කිරීම - දත්ත අංක ගණිතමය හෝ තර්කානුකූලව හෝ ක්‍රියාවලියකට භාජනය කිරීම
4. සාරාංශකරණය - දත්ත වලින් යම් අදහසක් ඇති කර ගත හැකි ලෙස කෙටිකර දැක්වීම

(නම් කිරීමට 01යි පැහැදිලි කිරීමට 01යි)

(ආ)

වේගවත් බව, නිවැරදිතාව, නම්‍යශීලී බව ,විශ්වාසවන්ත බව, ගුණාත්මක භාවය වර්ධනය වීම, වැඩි තොරතුරු ප්‍රමාණයක් කළමනාකරණය කිරීම ,අඩු සේවක සංඛ්‍යාව ප්‍රමාණවත් වීම, අඩු ඉඩකඩ ,පිරිවැය අඩුවීම

(ල.02)

II. (අ) අසත්‍ය දෑ ප්‍රචාරණය, කීර්තිනාමයට හානි කිරීම, ව්‍යාපාරවල තොරතුරුවල සත්‍යතාවයට හානි කිරීම

(ල.02)

(ආ)

- ලෝක ව්‍යාප්ත අන්තර්ජාල පහසුකම
- විද්‍යුත් තැපැල් ගොනු හුවමාරු නියමාවලිය
- කතන පහසුකම්
- ප්‍රවෘත්ති කණ්ඩායම්
- ටෙලි පරිගණක

(4ක් නම් කිරීමට ලකුණු 1යි පැහැදිලි කිරීමට 1/2×2)

III.

- පර්යේෂණ වියදම්
- ලියාපදිංචි වියදම්
- ආරම්භ කිරීමට පෙර මෙහෙයුම් වියදම්
- ප්‍රාග්ධන සම්පාදනය සඳහා දරන පිරිවැය
- ජංගම නොවන වත්කම් අත්පත් කර ගැනීමේ වියදම් (ල.04)

IV.

- ව්‍යාපාරිකයාගේ නම හා ලිපි යොමුව,ව්‍යාපාර ඉතිහාසය, ව්‍යාපාරයේ දැක්ම නිෂ්ඨාව, පරමාර්ථ හා අරමුණු නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩය හෝ සේවාව, තරග කිරීමට සිදුවන වෙළඳපොළ, ප්‍රධාන කළමනාකරන කණ්ඩායම්, ආයෝජන හුවමාරුව, අපේක්ෂිත ණය ප්‍රමාණය (ල.04)

V.

- මෝස්තර සැකසීම හා නිෂ්පාදන කටයුතු සිදුකිරීමේදී
- අවදානම් සහිත ව්‍යාපාර කටයුතුවලදී
- භාණ්ඩ හා සේවා බෙදා ගැනීමේ කටයුතුවලදී
- ප්‍රවර්ධන කටයුතුවලදී

Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!

- මිනිස් ස්පර්ශයෙන් තොරව වඩාත් පවිත්‍රව සිදුවිය යුතු ව්‍යාපාර කටයුතුවලදී
  (වෙනත් පිළිගත හැකි ඕනෑම පිළිතුරකට ලකුණු එක බැගින් ලකුණු හතරක්)

PAST PAPERS WIKI

Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!

PARCEL NO

LOL.lk
BookStore

විභාග ඉලක්ක පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින් නිවසටම ගෙන්වා ගන්න

කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර | A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් | School Book ගුරු අතපොත්

PADANAMA PUBLICATION | pesuru Prakashana Private Ltd. | Akura Pilot | සමනල දැනුම | සුභාරු

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර, කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා

සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න